සයුරෙන්

# එතෙර

එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.
1 වන කාණ්ඩය 2 වන කලාපය
2020 අගෝස්තු



දොස් හැර සැප සතුට යුක්තිය පෙරමගට
අත්කර ජන මනස හරියට නිසි ලෙසට
දෙන්නට සිතුවෙ විශ්වාසය වැඩිකමට
පස් වසරකට බාරයි මේ රට නුඹට

# සයුරේ නී
# එතෙර

එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය.

අංක 450, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.
දුරකථන : +94 11 2689500-508 ෆැක්ස් : +94 11 2689510/2674347
ඊ මේල් : csl123@sltnet.lk අන්තර්ජාලය : www. ceylonshippinlines.com


## සළෙලකු හමුවේ තරුණියකගේ තොල්වැනිය

කලක් සිළුමිණ පුවත්පතේ කතෘ ධූරය දැරූ මීමන ප්‍රේමතිලක කොළඹ යුගයට අයත් කවියෙකි. සුවිශේෂී ආරකින් ශෘංගාරාත්මක හිටිවන කවි කීවේ දක්ෂයෙකු වූ මීමන එකල කවීන් අතර ඉහළම තැනක වැජඹිනි.

ජෝන් රාජදාස ද එසේමය ඔහුද කොළඹ යුගයේ ප්‍රකට කවියෙකි. අද මෙන් නොව එදා කවිය අවියක් වශයෙන් පැවැතින කවියට සමාජයේ ඉහළ ඉල්ලුමක් තිබුණි. කවි මඩු නිරන්තරයෙන් අසන්නට ලැබුණු අතර ඒවායේ රසිකයින් අසන්නන් පොදි කකා රැස්වී සිටියහ. දේශපාලන වේදිකාවේ පවා කවියෙන් අලංකාර විය.

දිනක් තෙල්දෙණියේ කවි මඩුවකි. එය මෙහෙයවූයේ ජෝන් රාජදාසය. ජෝන් රාජදාස කවියා මීමන ප්‍රේමතිලකයන්ට මෙසේ ආරාධනා කළේය.

කවියනි, කවි රසිකයිනි අද මෙහි ඉන්න
දැන් කාලයයි මී වදවල පැණි බොන්න
පුළුවන් කෙනෙක් කවිපොරයට පැටලෙන්න
ඇඟපත ගසා දා සූදානම් වන්න

කළඹා විනෝදයකින් කවි පැණි හැළිය
ලැබ නව පණක් හිනැහෙයි සරසවි නිළිය
තෙල්දෙණි නව කලාවලියේ ඇති එළිය
අද පැහැදිළිය අද හොඳටම පැහැදිළිය

ලංකා කවි සමාජයේ මුල් අසුන ගෙන
හෙළ කවි ලෝකයට වී අඹ රසය දෙන
මීමන කිවිඳු වැනි වූ මගෙ දෙවැනි පණ
ඔබේ කවි සළඹ සොළවා රඟ කරනු මැන

එම ආරාධනය පිළිගනිමින් වේදිකාවට පැමිණි මීමන මෙසේ කීය.

කල්ගත කරන මුත් ඊයේ සිටම ලෙඩින්
ඉල්ලන කවිය කිව යුතුමය පරළ හඩින්
ඇල්ලක දොළක හෝ ගිරි ශිඛර උඩින්
තෙල් දෙණි කලා උළෙලට සරසවිය වඩින්

වෙහෙසී සිටින මුත් බී කවි මල් පැණිය
මගේ කවි රැජිනියගෙ රැවු මිණි සෙළමිණිය
කිවකැයි කියන්නද අද මේ තෙල්දෙණිය
සළෙලකු හමුවෙ තරුණියකගෙ තොල්වැනිය.

## සුදු ජිරාෆ් තිදෙනාගෙන් දෙදෙනෙකු මරා දමයි.




**කෙන්යා වනාන්තරවල ජීවත් වූ අතිශය දුර්ලභ සුදු ජිරාෆ් සතුන් දෙදෙනකු දඩයක්කරුවන් විසින් මරා දමා ඇති බවට තොරතුරු වාර්තාවෙයි. මෙසේ මරා දමා ඇත්තේ ගැහැණු සතෙකු හා එම සතාගේ පැටවාය.**

තවත් එක් සුදු පැහැති ජිරාෆ් සත්වයෙකු පමණක් දැනට ජීවත්ව සිටින අතර එම සත්වයා දැනට ලෝකයේ ඉතිරිව සිටින එකම සුදු ජිරාෆ් සත්වයා ලෙස සැලකෙයි.

මෙම සත්වයින්ට සුදු පැහැයක් ලැබී ඇත්තේ සමේ වර්ණක නොමැති වීම හේතුවෙනි. මුල්වරට 2017 වර්ෂයේදී මෙම සතුන් පරිසර වේදීන් ගේ ඇස ගැටී ඇති අතර එහිදී ගත් ඡායාරූප හේතුවෙන් මොවුන් පිළිබඳ ලොව පුරා ප්‍රචාරය වන්නට විය. තම සතුන් දෙදෙනා කවුරුන් විසින් කුමන අරමුණක් සඳහා මරා දමා ඇත්දැයි තාමත් සොයාගෙන නැත.

# ඔබේ අක්මාවේ තෙල් තැන්පත්වී ඇද්ද?

**මිනිස් සිරුරේ අක්මාව යනු කාර්යයන් රැසක් ඉටු කරන ඉන්ද්‍රියකි. ඔබ නිසියාකාරව නොහැසිරී වැරදි පුරුදු ඇතිකර ගත හොත් එම ඉන්ද්‍රිය රෝගී විය හැක. එසේ වූ විට විවිධ රෝගාබාධයන්ට ලක්වී මරණය පවා ගෙන දිය හැක. අක්මාවේ තෙල් තැන්පත් වීම මේ දිනවල නිතර ඇසෙන්නට ලැබෙන රෝගී තත්ත්වයකි. අක්මාවේ තෙල් නම් එය පාලනය කිරීම සඳහා පහත උපදෙස් පිළිපදින්න.**





1. ගැඹුරු තෙලේ බදින ලද ආහාර වර්ග අනුභවය හැකි කරම් අඩුකරන්න. තෙල් සහිත ආහාර ක්ෂණික ආහාර පාන්පිටි බහුල ආහාර අවම කරන්න.

2. කොත්තු, පරාටා, පාන්, ඉදිආප්ප, ෆ්‍රයිඩ් රයිස් වැනි ආහාර වලින් අත මිදෙන්න.

3. ඉස්සන්, දැල්ලන්, කකුළුවන් , පොකිරිස්සන්, ඌරුමස් හරක්මස් වැන් දේ ආහාරයට නොගන්න.

4. චීස් බටර් මාගරින් මුදවපු කිරි කිරිපිටි වැනි ආහාර භාවිතය අක්මාවේ තෙල් වැඩි කරන ආහාර බව මතක තබාගන්න.

5. ආහාර පිසීමේදී තෙල් භාවිතය හැකි තරම් අඩුකරන්න.

6. ඇල්කොහොල්, දුම්වැටි හා මත්ද්‍රව්‍ය භාවිතා කරන්නෙක් නම් වහාම එය නතර කරන්න.

7. දිනකට අවම වශයෙන් විනාඩි 40-60 ක් පමණ හොඳින් දහඩිය දමන තුරු ඇවිදින්න. ව්‍යායායාම කරන්න.

8. ගොටුකොළ, කරපිංචා, කොළ කැඳ නිරන්තරයෙන් ඔබේ ආහාරයට එක්කරන්න.



9. ත්‍රිපලා චූර්ණය හෝ ත්‍රිපලා කරල් හෝ පෙති වෛද්‍ය උපදෙස්වලට අනුව සුදුසු මාත්‍රාවකින් යුතුව පානය කිරීම මේ සඳහා ගුණදායකය.

10. දීර්ඝ කාලීනව ඔබ යම් අසනීපයකට පත්ව සිටීනම් හෝ ශරීරය ස්ථූලතාව වැඩිනම් හෝ නිතර කොලෙස්ට්‍රෝල් මට්ටම ඉහළ යන අයෙක් නම් කොලෙස්ට්‍රෝල් මට්ටම ඉහළ ගොස් ඇති විටක උදේ අවදිවනවිට පයේ වළළුකර ප්‍රදේශය ඉදිමී ඇත්නම්, මුත්‍රාවල වර්ණය අදුරු පැහැ නම් වෙනදාට වඩා වෙහෙසකර බවක් දැනෙන්නේ නම් ඔබ වෛද්‍ය උපදෙස් මත අක්මාව පරීක්ෂා කරගන්න.

යම් රෝගයකට ප්‍රතිකාර කරනව වෙනුවට එය වලක්වා ගැනීම ඥානවන්තයාගේ ලක්ෂණයයි. එබැවින් අක්මාව ඉදිමීමට පෙර ව්‍යායාම හා ආහාර රටාව පිළිබඳව නැවත සිතා බලා කටයුතු කරන්න.


ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට
පිටරට සිට එවන මුදල් ලබාගන්නා ඔබ සඳහාම
විශේෂිත රෙමිටන්ස් කාඩ්පතක්
Remittance Card
COMMERCIAL BANK
1234 4567 1234 4567
5189
VALID THRU
MONTH/YEAR 10 / 20
VISA
ඔබේ රෙමිටන්ස් කාඩ්පත අදම ලබාගෙන මෙම සියලු වාසි අත්විඳින්න.
● ආරම්භක ගාස්තු නොමැතිව නොමිලේ කාඩ්පතක් ලැබීම.
● පිටරට සිට ලැබෙන මුදල් එසැණින් ඔබගේ ගිණුමට ලැබීම.
● දවසේ ඕනෑම වේලාවක මුදල් ලබාගැනීමට දිවයින පුරා විහිදුනු ATM ජාලය.
● විවිධ භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට Debit Card පතක් ලෙසින්ද ශ්‍රී ලංකාවේ සහ පිටරට දී භාවිතා කිරීමේ හැකියාව.
● කාඩ්පත් හිමියන් සඳහා වසර පුරා හිමිවන සුවිශේෂී වට්ටම් හා දීමනා.
● පිටරට සිට එවන මුදල් ලබාගන්නන් හට ලබාදෙන සුවිශේෂී එහළිසි ණය' පහසුකම.
● බැංකුව මගින් පවත්වන ප්‍රවර්ධන වැඩසටහන් වලදී වැඩි දිනුම් අවස්ථා හිමිවීම.
● බැංකුවේ සුවිශේෂී ගණුදෙනුකරුවන් හට හිමිවන වරප්‍රසාද වැඩසටහන් සඳහා සුදුසුකම් ලැබීම.
කොමර්ෂල් බැංකුවේ e-Exchange, වෙලාවට පරිස්සමට පිටරට සිට මුදල්
100 YEARS
COMMERCIAL BANK
*කොන්දේසි සහිතයි | Fitch Rating AA (lka) | +94 112 353 576 | www.combank.lk
ඔබේ ජය අපේ පැතුමයි

# පරණ පක්ෂ ගෙදර යවා අලුත් පක්ෂ කරළියට ගෙනා මෙවර මැතිවරණය

ජනාධිපතිවරණය අවසන් වී අට මසකදී මහා මැතිවරණය පැවැත්විණි. මේ මැතිවරණය පැවැත්වීමට දින යෙදී තිබුණේ අප්‍රේල් 25 දිනයටය. එහෙත් කොරෝනා වසංගතය හේතුවෙන් එය අගෝස්තු 05 දිනය දක්වා කල්ගියේය.

මෙම මැතිවරණයට පක්ෂ විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් විය. ලංකාවේ දේශපාලනය තුළ ප්‍රධාන දේශපාලන කඳවුරු දෙකක් තිබුණි. ඒ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ පිල හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන කරගත් පිල වශයෙනි. එම පිල් දෙකම ඉවතට විසි වී ගිය අතර අලුත්ම දේශපාලන ක්ෂේත්‍රයන් දෙකක් මෙවර ජනතාව ඉදිරියට ගෙන ආවේය.

එකක් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණයි. අනෙක සමගි ජන බලවේගයයි. පොදු ජන පෙරමුණ බිහිවන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිඳී යෑමෙනි. සමගි ජන බලවේගය බිහි වන්නේ එක්සත් ජාතික පක්ෂය බිඳී යෑමෙනි.

එම පක්ෂ දෙකම බිඳී නව පක්ෂ බිහිවන්නේ එම පක්ෂ දෙක තුළම අභ්‍යන්තරයේ ගොඩ නැගෙන බල අරගලයන් හේතුවෙනි.

එසේ බිඳී ගොස් නව පක්ෂ මුහුණ දෙන පළමු පාර්ලිමේන්තු මැතිවරණය මෙය වන අතර පොදු ජන පෙරමුණ ගොඩනැගී ඔවුන් මීට පෙර පළාත් පාලන හා ජනාධිපතිවරණ යන මැතිවරණ දෙකටද මුහුණ දුන්හ. ඒවාද ජය ගත්හ.

සමගි ජන බලවේග යට සජිත් ප්‍රේමදාස මහතා නායකත්වය ලබාදුන් අතර පොදුජන පෙරමුණට මහින්ද රාජපක්ෂ මහතා නායකත්වය ලබා දුන්නේය. ජනතා විමුක්ති පෙරමුණ පෙරටුකරගත් ජාතික ජන බලවේගයට අනුර කුමාර දිසානායක නායකත්වය දුන්නේය.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ලබාගත් සමස්ත ප්‍රතිඵලය 59.09% ක් විය. එය ඡන්ද වශයෙන් ගත්කළ 6,853,639 කි. මන්ත්‍රී ධුර 145 කි. සමගි ජන බලවේගය 2,771,984 ක් වූ අතර ප්‍රතිශතයක් වශයෙන් 23.90% කි. ඒ සඳහා ඔවුන්ට මන්ත්‍රී ධුර 59 ක් ලැබුණි. ජාතික ජන බලවේගයට ඡන්ද 445,958 ක් ලැබුණු අතර මන්ත්‍රී ධුර ලැබුණේ 03 කි. ඉලංගෙයි තමිල් අරුසු කච්චි පක්ෂය ඡන්ද 327,168 ක් ලබාගත් අතර මන්ත්‍රී ධුර 10 ක් දිනාගත්තේය. එක්සත් ජාතික පක්ෂය මුළු ලංකාවෙන්ම ඡන්ද 249,433 ක් ලබාගත් අතර මන්ත්‍රී ධුර ලැබුණේ 01 ක් පමණි. අපේ ජාතික ජන බලවේගය නමින් ඉදිරිපත් වූ පක්ෂයට ද ඡන්ද 67,758 ලැබුණු අතර එයට ද එක් මන්ත්‍රීධුරයක් හිමි විය.

මෙවර මැතිවරණයෙන් පසු බොහෝ දෙනෙකුගේ කතා බහට ලක්වූ ප්‍රධාන මාතෘකාව වූයේ ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ ජයග්‍රහනයත් එ.ජා.ප. අත්වූ ඛේදනීය ඉරණම ගැනය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයින් 16 දෙනෙකු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ යටතේ ඉදිරිපත් වූ අතර ඉන් 14 දෙනෙකුම ජයග්‍රහනය කළහ. එයින් එම පක්ෂයේ නම යන්තමින් හෝ රැක ගැනීමට ඔවුන්ට හැකි වූහ.

උතුරු නැගෙනහිර හැර ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක්ම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඉහළ ප්‍රතිශතයකින් ජයග්‍රහනය කළ අතර ඒ හැම තැනකම එ.ජා.ප. අන්ත පරාජයක් ලැබීය.

ආසන මට්ටමින් ගත් කළ එ.ජා.ප. යේ ප්‍රබල බලකොටුවක් වූ කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු කොළඹ, දකුණු කොළඹ, නැගෙනහිර කොළඹ, බටහිර කොළඹ, බොරැල්ල, රත්මලාන ආදී ආසන සමගි ජන බලවේග යට ඉහළ ප්‍රතිශතයකින් ජයග්‍රහනය කළේය. බොහෝ දෙනෙකු විශ්වාස කළේ එම ආසනවල යම් තරමක ඡන්ද ප්‍රමාණයක් එ.ජා.ප.යට හිමිවනු ඇති යන්නයි.

මීට වසර පහකට පෙර රට පාලනය කළ පක්ෂය වසර පහකින් මේ තරම් පහළට ඇද වැටුණේ ඇයිද යන්න එම පක්ෂයට ලැදි ජනයාට තාමත් සිතාගත නොහැක.

ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ බිහිවූයේ 2016 තරම් මෑත යුගයේය. ඔවුන් මෙතරම් ඉහළට ඔසවා තැබීමට ජනතාව පෙළඹවීම අදහා ගත නොහැකි තරම්ය.

සමගි ජන බලවේගය බිහි වන්නේම මෙම මැතිවරණය ඉලක්ක කරගෙනය. ආරම්භක පියවරක් වශයෙන් ඔවුන් ආපු දුර පිළිබඳව ඔවුන්ට සතුටු විය හැකිය.

පැරණිම හා ප්‍රබලම දේශපාලන පක්ෂය වූ එ.ජා.පක්ෂය පහළම අඩියට යද්දී ජනතා විමුක්ති පෙරමුණ ද හිටපු තැනින් පහළට ඇද වැටුණි. ගෙවුණු පාර්ලිමේන්තුවේ ආසන 06 ක් දිනා සිටි ඔවුන් මෙවර ලබා ගත්තේ මන්ත්‍රී ආසන 03 කි. ඔවුන් ද සිටින තැනින් ඉහළට ඒමක් පේන මානයක නොමැත.

එ.ජා.ප. ඇද වැටුණු ඛේදනීය තත්ත්වය දෙගුණ තෙගුණ වූයේ පාර්ලිමේන්තුව මුල්වරට රැස්වූ දිනයේය. එම පක්ෂයට ජාතික ලැයිස්තුවෙන් ලැබුණු එකම මන්ත්‍රීධුරය සඳහාද අයෙකු නම්කර නොතිබීම හේතුවෙනි. ඒ සඳහා සුදුස්සෙකු සොයා ගැනීමට තාමත් එම පක්ෂය අපොහොසත් වීම එක් අතකින් සිය පක්ෂය අත නොහැර එළෙසම සිට ඡන්දය දුන් ජනතාවට කෙරෙන නිගාවකි. පාර්ලිමේන්තු ඉතිහාසය තුළ එ.ජා.ප. නියෝජනයක් නොමැතිව ආරම්භ වූ පළමු පාර්ලිමේන්තු සැසි වාරය මෙය වෙයි.

අපේ ජන බල පක්ෂය නමින් පක්ෂයක් මෙවර තරග බිමට එක් විය. දිස්ත්‍රික්ක කීපයකට ඡන්දය ඉල්ලූ අතර භික්ෂූන් වහන්සේලා දෙනමක් ඒ සඳහා නායකත්වය ලබා දුන්හ. ඒ ගලබොඩ අත්තේ ඥානසාර හිමි හා අතුරලියේ රතන හිමිය. රතන හිමි මින් පෙර වසර 15 ක් පමණ පාර්ලිමේන්තුව නියෝජනය කළ අයෙකු වන අතර යම් යම් ජාතික ප්‍රශ්න ඉදිරියේ අරගල සටන් කළ අයෙකි. ගලබොඩ අත්තේ ඥානසාර හිමිද මේ රටේ ජාතික අරගලවලට නායකත්වය දුන් අයෙකි. ජාතික ප්‍රශ්න ඉදිරියේ ඒ ඒ මොහොතට ඒ අයගේ හඬට ජනයා අවධානය යොමු කළත් මේ අය පිළිබඳව එතරම්ම ජනතා ප්‍රසාදයක් නොමැති බව මෙම මැතිවරණයෙන් කදිමට පැහැදිලි විය. ලංකාවෙන්ම ඡන්ද 67,758 ප්‍රමාණයක් ගත් හේතුවෙන් ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රී ධුරයක් හිමි වූ අර පාර්ලිමේන්තුවට රැස්වූ පළමු දිනය වන විටත් මෙම මන්ත්‍රී ධුරයට අයෙකු පත් කිරීමට එම පක්ෂයට හැකි වී නොමැත. එම පක්ෂය බරපතල අර්බුධ රැසකට මුහුණ දී සිටියි.

මෙහි ඇති ඛේදනීයත්වය නම් ඔවුන් භික්ෂූන් වහන්සේලා වශයෙන් බුද්ධ චීවරය ඇඟලාගෙන කරන මෙම බල ලෝභී දේශපාලන ක්‍රියාවලිය අතිශය පිළිකුල් සහගතය. ලෝකය ඉදිරියේ භික්ෂුත්වය හෑල්ලුවට ලක් කරන මොවුන්ට ඡන්දය නොදී සිටීමට තරම් ජනතාවට ප්‍රඥාව පහල නොවීම බෞද්ධකමට නිගාවකි. තවද එම පක්ෂය විසින් සිය ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයට අයෙකු නම් නොකිරීම තුළ පවතින්නේ බල ලෝභී කුමන්ත්‍රණයකි. මන්ත්‍රී ධුරය දැරීම මේ තරම් රසමසවුලක් වන්නේ කෙසේ දැයි තේරුම් ගැනීම ඉතාම සංකීර්ණ කරුණකි.

මේ අතර නැගෙනහිර අතාවුල්ලා සහ පිල්ලෙයාන් යන දෙදෙනාද මන්ත්‍රීධුර ලබාගෙන ඇති අතර යාපනයට වෙනම තරග වැදුනු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටද මන්ත්‍රීධුරයක් හිමි වී ඇත. උතුරු නැගෙනහිර සිටි මහ ඇමති විග්නේෂ්වරන් මහතාද මන්ත්‍රී ධුරයක් ලබාගත් අතර උතුරේ පැවැති දේශපාලන ඒකාධිකාරිය මෙවර බිඳ වැටී ඇත.

ආණ්ඩු පක්ෂය නියෝජනය කරන පොදු ජන පෙරමුණ මන්ත්‍රී ධුර 145 ක් ලබා ගැනීම අති විශිෂ්ට ජයග්‍රහනයකි. සමානුපාතික නියෝජනය ක්‍රමය යටතේ තුනෙන් දෙකක් ලබාගැනීම කිසි විටක කළ නොහැකි බවට මින් පෙර දේශපාලන විශ්ලේෂකයින් කර තිබූ පුරෝකතන උඩු යටිකුරු කළ මැතිවරණයක් බවට මෙම මැතිවරණය පත්විය.

කුමන පක්ෂයකට හෝ ජයග්‍රහනයට වඩා අපහසු වන්නේ ලැබූ ජයග්‍රහනය එලෙසින්ම රදවාගෙන තබා ගැනීමයි. බලෙන් හා ජනතා සිතුම් පැතුම් යටකර තබා ගන්නා බලයෙන් වැඩක් නැත. ජනතා කැමැත්ත හා බලය රැක ගැනීම අඟනේය. පරාජයේදීද එසේමය. පරාජයට හේතුව අවංකව විමසා බලා එයට සාධනීය පිළිතුරු සොයා ගතහොත් ජයග්‍රහනය වැඩි ඈතක නොවේ.

ජයග්‍රාහී පිළ ගැන හෝ පරාජිත පිළ පිළිබඳව අනාවැකි කීමට තාමත් කාලය මදිය.



| පක්ෂය | ඡන්ද සංඛ්‍යාව | ප්‍රතිශතය | ආසන ගණන |
|---|---|---|---|
| ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ | 6,853,639 | 59.09% | 145 |
| සමගි ජන බලවේගය | 2,771,984 | 23.90% | 54 |
| ජාතික ජන බලවේගය | 445,958 | 3.84% | 03 |
| ඉලංගෙයි තමිල් අරුසු කච්චි පක්ෂය | 327,168 | 2.82% | 10 |
| එක්සත් ජාතික පක්ෂය | 249,433 | 2.15% | 01 |
| අපේ ජාතික ජන බලවේගය | 67,758 | 0.58% | 01 |

**උතුරු නැගෙනහිර හැර ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක්ම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඉහළ ප්‍රතිශතයකින් ජයග්‍රහනය කළ අතර ඒ හැම තැනකම එ.ජා.ප. අන්ත පරාජයක් ලැබීය.**



# පිටරට සිට ශ්‍රී ලංකාවට මුදල් එවන්න

පහසු, ආරක්ෂිත, වේගවත් ක්‍රම රැසක් දැන් සෙලාන් බැංකුවෙන්

**සෙලාන් බැංකුවට මුදල් එවිය හැකි මුදල් හුවමාරු සේවා**

Trans-Fast Worldwide Money Transfer | LuLu Money | Instant Cash Global Money Transfer | Speedcash Now | Ria Money Transfer | Unistream Money Transfers | Worldwide Cash Express Money Transfer | Speed Send | samba سامبا | Placid Express Worldwide Money Transmitter | الفردان للصرافة Alfardan Exchange | TeleMoney | إنجاز enjaz banking services | WesternUnion WU | Fawri فوري

**ඔබ වෙනුවෙන් සේවයට කැප වූ සෙලාන් බැංකු නියෝජිතයා**

සවුදි අරාබිය කාංචන හේමකීර්ති : 00966 559300872

* කොන්දේසි සහිතයි

www.seylan.lk

+94 11 200 88 88

සෙලාන් බැංකුව සුහද හදක් ඇති දේශීය බැංකුව

Brand Finance Rating “A+” Fitch Rating: ‘A (lka)’ සමාගම ලියාපදිංචි අංකය: PQ 9 සෙලාන් බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි




# අසාර්ථකත්වයෙන් සාර්ථකත්වයට ගිය සැන්ඩර්ස්ගේ KFC

**මිනිසෙකුට සාර්ථකවීමට කාල වකවානුවක් නැත. එය ජීවිතයේ මුල මැද අග කියා කාලයක් නැත. අවශ්‍ය වන්නේ උත්සාහය විශ්වාසවන්ත බව හා අධිෂ්ඨානයයි. මේ සියල්ල එක්තැන්කළ චරිතයක් වූයේ හාර්ඩ්ලන්ඩ් සැන්ඩර්ස්ය. කේ.එෆ්.සී. අවන්හල් ජාලයේ නිර්මාතෘ ඔහුය.**

සැන්ඩර්ස් ඇමරිකාවේ ඉන්දියා පළාතේ හෙන්විල් නගරයට ආසන්නයේ උපත ලබන්නේ කුඩා දුප්පත් පවුලකය. ඔහුට බාල සහෝදරයෙක් හා සහෝදරියක් සිටියහ. සැන්ඩර්ස් වයස අවුරුදු 05 දී සිය පියා මිය යන නිසා මවට රැකියාවක් කිරීමට සිදුවෙයි.


ඔහුගේ මව රැකියාවට යන්නේ පස්හැවිරිදි සැන්ඩර්ස්ට පුංචි දරු දෙදෙනා බාරදීමෙනි. වයස පහේදීකුඩා දරු දෙදෙනා බලා ගැනීමේ වගකීම ඔහු වෙත පැවැරෙයි. සමහර දින වලට මවට සවසට ගෙදර ඒමට අවසර නොලැබෙයි. රාත්‍රියේදී ද සිය සේවා ස්ථානයේ වැඩ කිරීමට සිදුවීම නිසාවෙනි. එවැනි දින වල පුංචි සැන්ඩර්ස් සිය නංගිට හා මල්ලිට ආහාර සපයා දෙයි. සරල ආහාරයක් පිස ගැනීමට සැන්ඩර්ස් පුහුණු වන්නේ වයස පහේ සිටය.

කාලය ගෙවෙද්දී සැන්ඩර්ස් ගේ මව මාග්‍රට් දෙවන විවාහයක් සිදුකර ගනී. එවිට සැන්ඩර්ස් ගේ වයස අවුරුදු 10 කි. සුළු පියා ගේ තාඩන පීඩන වලට ලක්වන සැන්ඩර්ස් ගොවිපලක රැකියාවක් සොයාගනී. එවිට ඔවුන් පදිංචිව සිටින්නේ ඉදියානා හි ග්‍රීන්වුඩ් ප්‍රදේශයේය. ගොවිපලේ රැකියාව කරමින් පාසැල් ගියද වීජ ගණිතයට තිබූ අසමත්කම හේතුවෙන් හත්වන ශ්‍රේණියෙන් පසු පාසලටද ඔහු ආයුබෝවන් කීවේය.

වයස 14 වන විට විවිධ රැකියා කළ සෝන්ඩර්ස් ගොවිපළ රැකියාවට නැවතත් අවතීර්ණ වී ඉන් අනතුරුව පින්තාරු රැකියාවක් තෝරා ගත්තේය. එහි ටික දිනක් සිට නැවතත් ගොවිපල රැකියාවකට ඇතුළු විය. ඊළඟට ඔහු තීරණය කළේ සිය මාමලාගේ ගෙදරට යෑමය. ඒ අම්මාගේ සහෝදරයාය. මාමා විසුවේ ඇල්බනී පලාතේය. එවිට ඔහුගේ වයස අවුරුදු 16 කි. මාමා කුලී රථ රියැදුරෙකි. මාමා සොන්ඩර්ස්ට කොන්දොස්තර රැකියාවක් සොයා දුන්නේය. මාස කීපයකින් එම රැකියාවද ඔහුට එපා විය. ඊළඟට ඔහු උප්පැන්නයේ උපන් දිනය වෙනස් කර හමුදාවට එක්විය. වැගන් රථ රියදුරු ඔහුට ලැබුන තනතුරයි. එම යුගයේ හැටියට එය කරත්ත දැක්වීමයි. වසරක සේවා කාලයෙන් පසු සැන්ඩර්ස් එම රැකියාව ද අතහැර දැමීය.

එම රැකියාව අත්හැරි සොන්ඩර්ස් ඊළඟට නැවතත් පැමිණියේ මාමා ළඟටය ඒ වන විට ඔහු පදිංචිව සිටියේ ෂෙෆිල්ඩ් හි ඇල්බාමා ප්‍රදේශයේය. එහි ඔහු එනවිට ඔහුගේ කුඩා සහෝදරයාද එහි පැමිණ සිටියේය. ඒ සුළු පියාගේ කරදර හේතුවෙනි. ඒ වන විට මාමා දුම්රිය ස්ථානයක රැකියාවක් කරමින් සිටියේය. සොන්ඩර්ස්ට ද දුම්රිය පළක සුළු රැකියාවක් සොයා දුන්නේය. ඒ අල්බාමා හි ජාස්පර් දුම්රියපළේය. ඒ අළු බඳුන් පිරිසිදු කිරීමටය. එම රැකියාවටද මාස දෙක තුනකට වඩා ආයුෂ තිබුණේ නැත. ඊළඟට ඔහු තෝරා ගත්තේ ගිනි නිවන භටයෙකු ලෙස සේවය කිරීමයි.

මේ කාලයේ ඔහු පෙම් හබයකටද පෙරලුනි. පෙම්වතිය ඩොසපින් කිංය. ඔහු ඇය සමඟ විවාහ විය. එවිට ඔහුගේ වයස 18 කි. ජාක්සන් ටෙනිසි පළාතේ නව යුවළ පදිංචි විය. සොන්ඩර්ස් ගේ රැකියාව වෙනස් කිරීම නොනැවතී ඉදිරියට ගියේය. පළමු දරුවා සෙම්රෝගයකින් මිය ගියේය. එයින් සොන්ඩර්ස් බලවත් සේ කම්පනයට පත්විය. එය ඔහුට දරාගත නොහැකි තරම් වේදනාවක් විය. පසුව ඔහුට ආව උපත ලද දියනියන් දෙදෙනා නිසා ඔහුගේ වේදනාව තරමක් තුනී විය. දවල්ට ගිනි බටයෙකු වූ ඔහු රාත්‍රියට විශ්ව විද්‍යාලයක් මගින් තැපැල් මාර්ගිකව නීති විෂය ඉගෙන ගන්නට උත්සහ කළේ නීතිවේදියෙකු වීමේ ආශාවෙනි.



මොහුගේ මේ කලබලකාරී ජීවිතයත් අරමුණක් නොමැතිව කටයුතු කිරීමත් එක රැකියාවක දිගින් දිගට කටයුතු නොකිරීම ආදී කරුණුත් හේතුවෙන් ජොෂපින් ගතකළේ තෘප්තිමත් ජීවිතයක් නොවේ. බැරිම තැන ඇය ඇඩි තීරණයක් ගත්තාය. “මම යනවා මගේ දෙමව්පියන් ළඟට” ඇගේ අවසන් තීන්දුව වූයේ එයයි. ඇය දරු දෙදෙනාද රැගෙන යන්න ගියාය.

දැන් සැන්ඩර්ස්ට ජීවිතය පටන් ගැනීමට තැනක් නැත. හෙන්රිවෙල්හි රේල්පාරේ කම්කරුවෙකු ලෙස ඔහු නැවතත් රැකියාවක් සොයා ගත්තේය. එයට ගත වූයේ කෙටි කාලයකි. ඒකත් අතහැර දැමීය. ඒ 1916 වසරයි. ජෙෆර්සන් විල් වෙත ගිය ඔහු එහි රක්ෂණ ක්ෂේත්‍රයේ රැකියාවක් සොයා ගත්තේය. ඔහුගේ අකීකරුකම හේතුවෙන් ඔහු සේවයෙන් නෙරපා හරිනු ලැබීය. ඊළඟට නිව් ඩර්සි වෙත පැමිණ එහි රක්ෂණ සමාගමකට සම්බන්ධ විය. එහි ටික දිනක් සිටින විට බෝට්ටු සේවයක් ආරම්භ කිරීමේ අවස්ථාවක් ලැබුණි.

ඒ 1920 වසරේදීය. ජෙෆර්සන්විල් හා ලුවිස්විල් අතර පිහිටි ඔහියෝ ගංගාවේ බෝට්ටු සේවාවක් ආරම්භ කළේ හවුල් ව්‍යාපාරයක් ලෙසිනි. එහි ඔහුට සුළු කොටස් ප්‍රමාණයක්ද හිමි විය. ඉන්දියානා හි කොළොම්බස් වානිජ්‍ය මණ්ඩලයේ ලේකම්කමද ඔහුට ලැබිණි. එය තමාට නොගැලපෙන බව පවසා ඔහු එයින් අස්විය. එයින් අස්වන විට ඔහුට ඩොලර් 22,000 ක මුදලක් ලැබුණි.

**ඔහු ලෝකයට සළකුණක් තැබුවේය. එය අදත් එලෙසම පවතී. විවිධ මාර්ග ඔස්සේ ජීවිතය ජයගන්න උත්සහ කළද තමාට හිමි දේම හමුවිය යුතුය. ඔහුට එය හමු වූයේ 65 දීය. මිය යන්න දින කීපයකට පෙර ද ඔහු ඉතා හොඳ සක්‍රීය තත්ත්වයෙන් සිටියේය. සැන්ඩර්ස් චරිතය ලෝකයටම පරමාදර්ශි චරිතයකි.**

7 වැනි පිටුවට...

6 වැනි පිටුවෙන්....

# අසාර්ථකත්වයෙන් සාර්ථකත්වයට ගිය සැන්ඩර්ස්ගේ KFC

මේ අතර ඔහු තවත් රැකියා රැසක් කළේය. ඉහතින් දක්වා ඇත්තේ ඉන් කීපයක් පමණි. සමහර රැකියා මාසයට දෙකට සීමා විය. 1930 වනවිට ඔහු අවන්හලක කෝකියෙකු හා පිඟන් සෝදන්නෙකු ලෙස රැකියාව කරමින් සිටියේය. මේ අතර කාලයේ ඔහු උපන් ගමේ ෂෙල් සමාගමකට අයත් පිරවුම්හලක කුඩා ස්ථානයක් ලැබුණි. කෙන්ටකිනි ඇපලේෂන් කඳුපාමුල නිරන්තර සංචාරකයින් ගෙන් පිරුණු පරිසරයක් වූ නිසා අලුත් දෙයක් කළ යුතු යැයි ඔහුට සිතිනි. ඒ සඳහා ඔහු තෝරා ගත්තේ බැදූ මස් හා වෙනත් ආහාර වර්ග යි. එයට හොඳ ඉල්ලුමක් ඇතිවිය. සැන්ඩර්ස් ගේ ආහාරවල හොඳ රසයක් තිබිණි. ඔවුන් පොදි කකා ඒවා මිලදී ගත්හ.

"මම දක්ෂ මේ වැඩේට තමා" සැන්ඩර්ස්ට එසේ සිතුනි. දැන් ඔහුගේ කුඩා අවන්හලේ එක් මේසයක් වෙනුවට මේස දෙක තුනක් එක්විය. කල්යත්ම මේස ගනන වැඩි විය. 1937 වන විට ඔහුගේ මේස සංඛ්‍යාව 142 දක්වා වැඩිවිය. කෙන්ටකී ප්‍රදේශයේ පමණක් නොව මුළු ඇමරිකාව පුරාම එය ජනප්‍රිය වන්නට විය. ඒ වන විට ෂෙල් සමාගම් ඔවුන් ගේ පිරවුම් හල් රැසකට සැන්ඩර්ස් ට සිය ආහාර අලෙවිය කරගන යෑමට අවසර ලබා දුන්නේය.

ඉන්පසු සැන්ඩර්ස් සිය ව්‍යාපාරයට නමක්ද යොදා ගත්තේය. "සැන්ඩර්ස් කෝට් සහ කැෆේ" එහි නම විය. මේ වන විට ඔහුගේ වයස අවුරුදු 65 කි.

විවිධ වූ දුකගැහැට විදිමින් විවිධ රැකියාවල නිරත වෙමින් අයාලේ යන්නෙකු සේ දෛවය ඔහු වෙහෙසට පත්කර සොයන්නට ඇත්තේ තමාට උරුම දේ වන්නට ඇත. ඔහු එය සොයා ගන්නා විට ජීවිතේ තුනෙන් දෙකක් ගෙවා දමා අවසන්ය. එහෙත් ඔහු අධෛර්යයට පත්වූයේ නැත. කෙදිනක හෝ තමාට හරියන තමාට හිමි උපතින් ගෙනා දෙය හමුවන තෙක් ඔහු හාර හාර අවුස්සා දුක්වින්දේය.

ඔහු ඇඳුම වෙනස් කළේය. එය හරියට මැජික් කරුවෙකුගේ ඇඳුමක්




වැනිය. ඇත්තටම ඔහු මැජික් එකක් කළා වැනි නොවේද? 1955 වන විට ඇමරිකාවේ අන්තර් කලාප 75 ක ඔහුගේ අවන්හල් ජාලය ව්‍යාප්ත විය.

වෙනත් අවන්හල් සඳහාද වරලත්භාවය ලබා දුන්නේය. තම මිතරා වූ පීඩ් හර්ටන් වෙතද වරලත්භාවය ලබා දෙමින් ඔහුගේ අවන්හල් තුළද KFC අලෙවි කළේය. අනතුරුව දේශ දේශාන්තරවල ජනප්‍රිය වූ එම ආහාර අද තරුණ හා සුපිරි පැලැන්තියේ බොහෝ අයගේ දිවට රසඳුනකි. වයස අවුරුදු 88 වන විට ඔහු ලොව ජය ගෙන හමාරය. පසු කළෙක ඩොලර් බිලියන ගනනකට තම ව්‍යාපාරය හා සන්නාමය වෙනත් පාර්ශ්වයකට පැවරූ ඔහු විශ්‍රාම සුවය ගත කළේය.

කෙන්ටකී හි දුයිස්විල් හිදී වයස 90 දී ඔහු මිය ගියේය. ඔහු ලෝකයට සළකුණක් තැබුවේය. එය අදත් එලෙසම පවතී. විවිධ මාර්ග ඔස්සේ ජීවිතය ජයගන්න උත්සහ කළද තමාට හිමි දේම හමුවිය යුතුය. ඔහුට එය හමු වූයේ 65 දීය. මිය යන්න දින කීපයකට පෙර ද ඔහු ඉතා හොඳ සක්‍රීය තත්ත්වයෙන් සිටියේය. සැන්ඩර්ස් චරිතය ලෝකයටම පරමාදර්ශි චරිතයකි.


Ceylon Shipping Lines Ltd.
Printing Department



CSL Printing is a fully fledged design printing department equipped with latest technology including Computer offset printing from concept to finished product, with the capacity and capability to undertake all types of commercial printing for local & overseas customers.

Ceylon Shipping Lines Ltd.,
Printing Department,
No. 758/3, Dr. Danister De Silva Mawatha,
Colombo 09.
Tel: 011 - 2683237 Fax: 011 - 2683238
E- mail: cslpri@sltnet.lk

Head Office:
Ceylon Shipping Lines Ltd.,
No. 450, D.R. Wijewardana Mawatha,
Colombo 10.
Tel: 011 - 2689500 - 8


CEYLON SHIPPING LINES
TRAVELS & TOURS
Tel : +94 11 2689500 - 8
Fax : +94 11 2689510
E-mail : csltravels@sltnet.lk
Skype : csltravels
For more details, please click the below link
Click Please Here
IATA
ACCREDITED AGENT



# කොරෝනා පැතිරවීම නිසා මුළු රටෙන්ම බැණුම් අසන අංක 206 ලෙඩා

කොරෝනා වසංගතය නිසා මහත් විනාශයකට පත්වූ රටවල් අතර ඉතාලිය ඉදිරියෙන්ම සිටින රටකි. එම රටේ කොරෝනා රට පුරා ගෙන ගියේ අංක 3 දරන ලෙඩා බවට එරට බොහෝ දෙනෙකු ගේ විශ්වාසයයි.

ලංකාවේ කොරෝනා වැඩි පිරිසක් අතට පත්කළ රෝගියා වශයෙන් බහුතරයකගේ දෝෂ දර්ශනයට ලක්වන්නේ අංක 206 දරන රෝගියාය. මේ අංක 206 දරන රෝගියා ජා ඇල ප්‍රදේශයේ පදිංචි ප්‍රසාද් දිනේෂ්ය. ඔටෝ රික්ෂෝ රියැදුරෙකු වශයෙන් සිය වෘත්තිය කරන ඔහු මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවෙකු වෙයි. ඔහු ගේ කෝරෝනා වෛරස් පරීක්ෂණ යේදී (PCR) ඔහු ආසාධිතයෙකු ලෙස හඳුනා ගනු ලැබීය. ඔහුගේ ආශ්‍රිතයින් නිරෝධායනයට ලක් කිරීම සඳහා එම පිරිස් එකතු කිරීම ඊළඟ අභියෝගය විය. ඒ සඳහා නාවික හමුදාව මැදිහත් විය.

කුඩු සඳහා අබ්බැහිවූවන් හමුදාවේ හෝ රජයේ අනට කීකරුවන්නන් නොවේ. ඔවුන් නාවික හමුදාවට අල්ලා ගැනීමට සිදුවූයේ දාමරික අපරාධකරුවන් පිරිසක් අල්ලා ගන්නා විලසිනි.

දිනේෂ්ට කොරෝනා රෝගය වැළඳී ඇති බව දැනගත් පසු ඔහුගේ මිතුරන් අසල්වාසීන් හා ආශ්‍රිතයින් අල්ලා ගැනීමේ මෙහෙයුම සිදුකරනු ලැබුවේ නාවික හමුදාව මගිනි. එම ආශ්‍රිතයින් අල්ලා ගැනීම පහසු කටයුත්තක් නොවීය. එම මෙහෙයුමේදී නාවික හමුදාවට රෝගය බෝ විය. එතනින් සිදුවූ කොරෝනා ව්‍යාප්තිය 1000 ඉක්මවා ගියේය. ඒ ව්‍යාප්තිය රටටත් ජනතාවටත් මහත් බරක් විය.

> **නාවික හමුදාවට රෝගය බෝ විය. එතනින් සිදුවූ කොරෝනා ව්‍යාප්තිය 1000 ඉක්මවා ගියේය. ඒ ව්‍යාප්තිය රටටත් ජනතාවටත් මහත් බරක් විය.**
>
> **දිනෙන් දින නාවික හටයින්ගේ අසාධිත ප්‍රමාණය ඉහළ යමින් තිබූ අතර වැලිසර නාවික කඳවුරද වසා දැමීමට සිදුවිය. එක් කදවුරක් තුළ නාවික හටයින් 4000 ක් පමණ එකවර නිරෝධායනය කළහ. ඔවුන්ගේ ඥාති හිතවතුන් 200 ක් පමණ නිරෝධායනය වූහ. හැම විටම ගම්මාන 10-15 ත් අතර සංඛ්‍යාවක් හුදකලා කර තැබූහ.**

දිනෙන් දින නාවික හටයින්ගේ අසාධිත ප්‍රමාණය ඉහළ යමින් තිබූ අතර වැලිසර නාවික කඳවුරද වසා දැමීමට සිදුවිය. එක් කදවුරක් තුළ නාවික හටයින් 4000 ක් පමණ එකවර නිරෝධායනය කළහ. ඔවුන්ගේ ඥාති හිතවතුන් 200 ක් පමණ නිරෝධායනය වූහ. හැම විටම ගම්මාන 10-15 ත් අතර සංඛ්‍යාවක් හුදකලා කර තැබූහ. මේ වෛරස් ආසාදිතයින් දිනපතා හමුවන්නට වීමත් දිනපතා ගමක් දෙකක් හුදකලා කිරීමටත් නිවාස තුන හතරක් දිනපතා හුදකලා කිරීමත් නිසා රටම අනාරක්ෂිත තත්ත්වයට පත්වීම හා ජනතාව අතර මහත් බියක් පැතිරවීමටත් හේතුවූයේ මෙම 206 කොරෝනා ආසාධිතයාය.

ඔහු මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවී සිටි අයෙකි. ඒ නිසාම ඔහුට නිතර මත්ද්‍රව්‍ය ලබා ගැනීමට මුදල් අවශ්‍ය විය එයට රැකියාවෙන් උපයන මුදල ප්‍රමාණවත් නොවීය. සොරකම් කිරීමටද සිදුවෙයි. 206 න් සිදුවූ විපතේ මූලය සොයා යෑමේදී පෙනී යන්නේ මත්ද්‍රව්‍ය රටට ලෝකයට මොනතරම් විපතක් සිදුකරන්නේද යන්නය.

රටටම 206 ආසාධිතයා මහ විපතක් සිදුකළත් එයින් සිදුවූ සුගතියක්ද ඇත. එනම් දිනේෂ් කොරෝනා නිසා රෝහල් ගත කිරීමෙන් පසු ඔහු පුනරුත්තාපනය වීමෙන් පසු මත්ද්‍රව්‍ය භාවිතයෙන් අත්මිදී තිබීමයි. එක් අයෙකු හෝ මේ මහා විපතින් ගලවා ගැනීමට ලැබීම රටක් වශයෙන් ලබාගත් ජයග්‍රහනයකි.

තමා නැවත මත්ද්‍රව්‍ය පාවිච්චි නොකරන බවත් දූ දරුවන් සමඟ ඉතා සතුටින් ජීවත් වන බවත් දිනේෂ් පවසයි. කොරෝනා ව්‍යාසනයෙන් එම පවුලට සතුටින් ජීවත්වීමටත් පවුලේ එකමුතුව ඇතිවීමත් කොයිතරම් භාග්‍යයක්ද?

# ශ්‍රී ලංකාව ග්ලූටන් තොර රටක් කරමු.

**පාන්පිටි වලින් සකසන ලද ආහාර වර්ග ඔබ නිතර නිතර භාවිතා කරන්නේද? පාන්පිටි වල ග්ලූටන් නැමැති විෂ රසායනිකය අඩංගු බව ඔබ දැන සිටියාද? පාන්පිටි ගැඹුරු තෙලේ බැදීමේදී විවිධ විෂ ද්‍රව්‍ය නිෂ්පාදනය වන බව ඔබ දැනවත්ද?**

මේ ග්ලූටන් නැමැති විෂ විවිධ රෝග ගණනාවක් වැළඳීම සඳහා උපකාරී වන විෂ රසායනිකයකි. ග්ලූටන් වලින් තොර රටක් ඇති වීමට නම් අපි පාන් පිටි අනුභවය අත්හල යුතුය.

මීට දශක කීපයකට පෙර පාන්පිටි අනුභවය ඉතාම අඩු මට්ටමක පැවතුනි. ඒ කාලයේ පිළිකා, අධිරුධිර පීඩනය, දියවැඩියාව, කොලෙස්ටරෝල් ආදී රෝග වැළඳුනු රෝගීන්ද සමාජයේ දක්නට නොලැබුනි.



එහෙත් අද පාන්පිටි භාවිතය ඉහළ ගොස්ය. රෝගීන් ප්‍රමාණයද ඉහළ ගොසින්ය. සෑම තැනම වෛද්‍ය මධ්‍යස්ථාන ඔසුසැල් රසායනාගාර බිහිවී ඇත. මේ ගැන අපි කවුරුත් ගැඹුරින් සිතා බැලිය යුතු නොවේද?


ප්‍රතිසංස්කරණය කළ ගොඩනැගිල්ලක්



සෙල්ලිපිය සහිත ස්ථානය

# ඉතිහාසය නැවත කියවීමක් වෑන්න යායුතු හොඳම තැන දැන්

# රජගලතැන්න

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී වැඩියෙන්ම කතා කළේ අනුරාධපුරය පොළොන්නරුව යන දෙකය. ඉතිහාසයේ විශ්මිත විශ්කම් දැකීමටත් ඉතිහාසය මතුකරන ජීවමාන සාක්ෂි වන නෂ්ටාවශේෂ දැකීමටත් වන්දනා ගමන්, විනෝද චාරිකා, අධ්‍යාපන චාරිකා ආදී වශයෙන් බස් ලොරි වෑන් කාර් රැගෙන අපි ඒ දෙපොළට ඉතිහාසය පුරා ගියෙමු. එහෙත් දැන් අපිට තවත් එවැනිම ඓතිහාසික නටඹුන් සහිත අතීතාවර්ජනයේ ජීවමාන තක්ෂලාවක් බදු රජගලතැන්න හමුවී ඇත්තේ අම්පාරෙනි.**


පැරණි කුඩා දාගැබක්


ගල් උළුවස්ස සහිත බිත්තිය


ප්‍රතිසංස්කරණය කරන ලද දාගැබ



ශතවර්ෂාධික කාලයක් මහා වනයට යටවී වැද්දන් ගේ වාසස්ථාන බවටත් සොර දෙටුවන් ගේ ග්‍රහනයටත් හසුවී තිබූ රජගල ත්‍රස්ත උවදුරෙන් පසු පුරා විදු ඇසට හසුවී දැන් දැන් එළි පෙහෙළි වෙමින් තිබේ. මෙම

මෙහි මුලින්ම සෙල්ලිපි කියවීම අරඹා ඇත්තේ 1935 වසරේය. අනතුරුව 1950 දී තෝරාගත් ස්ථාන කීපයක කැනීම් සිදුකළ අතර එය දීර්ග වශයෙන් සිදු නොවුණි. විවිධ හේතුන් මත නැවත කැළයෙන් වසාගත් මෙම ස්ථානය 2009 දී යුද්දය අවසන් වීමෙන් පසු නැවත ඇරඹිනි.

ක්‍රිස්තුපූර්ව දෙවන සියවසේදී ආරම්භ කරන ලද මෙම මධ්‍යස්ථානය එතැන් සිට සියවස් දහයකට අධික කාලයක් බෞද්ධ මධ්‍යස්ථානයක් වශයෙන් මෙම ස්ථානය සංවර්ධනය වෙමින් පැවති ඇත. අවුරුදු දහස් ගනනක් මෙම ස්ථානයේ විවිධ අවශ්‍යතා සඳහා වරින් වර ඉදිකිරීම් සිදුවෙමින් රාජ අනුග්‍රහය ලබමින් පැවැති අනතුරුව කාලයිගේ ඇවෑමෙන් විනාශයට පත්ව අද වන විට ගණ වනයෙන් වැසී ගොස් පුරා විද්‍යාඥයන් සඳහා අජීවී සාක්ෂි ඉතිරි කර තබා නිහඩව සිටී.

පුරා විද්‍යාඥයන් සිය හැකි උපරිම කාලය බුද්ධිය වෙහෙසවා මෙම ස්ථානය ගවේෂණය කරමින් සිටිති. ඒ අනුව පුරා විද්‍යා ස්මාරක එනම් අතීතය හැදෑරුම සඳහා අවශ්‍ය වන ප්‍රබල සාක්ෂි 960 ට වැඩි ප්‍රමාණයක් මේ වන විට සොයා ගෙන ඇත. ඒ අතරින් ලැබී ඇති ප්‍රබලම සාක්ෂිය බවට පත්ව ඇත්තේ මිහිඳු මාහිමියන් හා ඉට්ඨිය තෙරුන් වහන්සේගේ නම සඳහන් ශිලා ලේඛනයයි.

තැනි තලා භූමියේ සිට කඳු මුදුනට යන විට පැරණි මාර්ග දෙක හමුවන ස්ථානය රාජධානියක් නොවන නමුත් බෞද්ධ ආගමික මධ්‍යස්ථානයක් වශයෙන් අතීතයේ පැවති තැනකි.

වර්තමානයේ රජගල, රජගලතැන්න, රාස්ස හෙළ ආදී නම් භාවිතා කළද අතීතයේදී ගිරි කුම්භීල යන නාමය භාවිතා කර ඇති බව සෙල්ලිපි අනුව තහවුරු වෙයි. සද්ධාතිස්ස රජුගේ පුත් ලජ්ජතිස්ස කුමාරයා විසින් ගිරි කුම්භිල විහාරය කරවූ බව පුරාවෘත්තාන්තවල දැක්වෙයි.

දුටුගැමුණු රජුගේ යුවරජු වූ එතුමාගේ මළනුවන් සද්ධාතිස්ස රජු දීඝවාපියේ සිටි බව ඉතිහාස කතාවල කියවේ.

11 වෙනි පිටුවට..

10 වෙනි පිටුවෙන්..

# රජගලතැන්න ....

**වර්තමානයේ රජගල, රජගලතැන්න, රාස්ස හෙළ ආදී නම් භාවිතා කළද අතීතයේදී ගිරි කුම්භීල යන නාමය භාවිතා කර ඇති බව සෙල්ලිපි අනුව තහවුරු වෙයි. සද්ධාතිස්ස රජුගේ පුත් ලජ්ජතිස්ස කුමාරයා විසින් ගිරි කුම්භිල විහාරය කරවූ බව පුරාවෘත්තාන්තවල දැක්වෙයි.**



ස්ථානයේ පිහිටි විශාල ගල්තලාව මත පැරණි ස්තූල දෙකක් ඇත. ඒ අසල කොටා ඇති සෙල් ලිපියේ "මෙම දිවයිනට පළමුවෙන්ම සමෘර්ධිය සඳහා පැමිණි ඉත්තිය තේරුන්ගෙ'ද මහින්ද තෙරුන්ගෙ'ද ස්තූපය" යන්න එහි සඳහන් කොට ඇත. ඒ අනුව මහින්ද හා ඉත්තිය තෙරුන්වහන්සේලාගේ ධාතූන් වහන්සේලා නිදන් කොට මෙම ස්තූපය ඉදිකරන්නට ඇතැයි විශ්වාස කළ හැක.

අනුරාධපුර යුගයෙන් පසු මෙම ස්ථානයේ කිසිඳු ඉදිකිරීමක් හෝ ප්‍රතිසංස්කරණයක් සිදුවූ බවට කිසිඳු සාක්ෂියක් නැත. අනුරාධපුර යුගයේ තැනූ බිත්ති හා වහළට ගල් පතුරු දෙකක් සවිකළ වර්ග අඩි 36 ක කුඩා ගොඩනැගිල්ලක් තාමත් නිරුපද්‍රිතව සොයා ගැනීමට හැකි වී තිබේ. මෙය භාවනා කුටියක් වශයෙන් සලකයි.



සම්පූර්ණයෙන්ම නිමවා නැති හිටි පිළිමය



ගල් පාත්‍ර සහිත ස්ථානය

ලංකාවේ වනගත චාරිකා හා වැද්දන් පිලිබඳ පර්යේෂන කළ ආර් එල්. ස්පිටල් මහතා ඔහුගේ පොත්වල තබා ඇති සටහන් වලට අනුව මෙම ප්‍රදේශයේ එකලා වැද්දන් වාසය කළ බව කියති.

2020 දී අවසන් කිරීමට නියමිතව තිබූ මෙහි පුරාවිද්‍යා කැනීම් ව්‍යාපෘතිය තවත් ඉදිරියට දර්ඝ කර ඇත. කි.මී. 1.5 ක් දුර පිය ගැටපෙළ සම්පූර්ණයෙන්ම සකසා අවසන් කර ඇත. ලජ් ජාතිස්ස රජුගේ ශෘනිකා නැමැති බිසව ඉදිකළ ගල්ලෙන ප්‍රතිසංස්කරණය කිරීමට හැකි වී ඇත. කඳු මුදුනේ තිබූ ගල් උළුවස්ස, බිත්ති පෙරලීමට ආසන්නව තිබූ ලෙනක්ද සම්පූර්ණයෙන් සංරක්ෂණය කර ඇත. මෙහි හමු වූ පැරණි දාගැබ් දෙකක් ප්‍රතිසංස්කරණය කර ඇති අතර චෛත්‍යය බුබ්බුලාකාරය. යූප ගල හා ගල් චත්‍රයන් එයට සවිකර තිබී ඇත. පැරණි බෝධිඝරය හා ලහ බත්ගෙය නැමැති භික්ෂූන්ගේ ප්‍රථම දාන බෙදාගන්නා ශාලාව සංරක්ෂණය කර ඇත.



ප්‍රතිමා ගෘහය

මීට අමතරව ඕවලාකාර දාන ශාලාව සංරක්ෂණය කර ඇත. මෙතෙක් කිසිඳු ස්ථානයක මෙවැනි ඕවලාකාර දාන ශාලාවක් හමු වී නැත.

තවද භික්ෂූන් වහන්සේලා ස්නානය කළ ජන්ථාගාරය හා පොහොය ගෙය සම්පූර්ණයෙන් සංරක්ෂණය කර අවසන් අතර ඒ අසල තිබූ තවත් ගොඩනැගිල්ලක් ද සංරක්ෂණය කර ඇතත් එය කුමක් සඳහා භාවිතා කළේද යන්න තාම හඳුනාගෙන නැත. දැනට පුරා විද්‍යාඥයන් එය ගබඩාවක් ලෙස හඳුන්වයි.

විශාල ගල් පාත්‍රා දෙකක් සහිත පැන් මඩුව සංරක්ෂණය කර ඇත. ඈත කඳු මුදුනින් එන ජල පහර මාර්ග දෙකකින් මෙම පාත්‍රා දෙක පිරෙයි. එය ඉතා මනරම්‍ය. මීට අමතරව මීටර් 100 ක් පමණ දිග වැවද සංරක්ෂණය වී අවසන්ය.

අටපට්ටම් සහිත ධාතු මන්දිරයක්ද පිළිම ගෙයක්ද හමුවී ඇති අතර ඒවා දෙමහල් ගොඩනැගිලි වශයෙන් තිබී ඇත. නිදන් සොරුන්ගේ ග්‍රහනයට හසුවී විනාශ වී තිබූ මේවා සංරක්ෂණය කිරීම අතිශ්‍යය දුෂ්කර කාර්යයක් වී ඇත. ප්‍රතිසංස්කරණය කරන ලද ගල් පඩිපෙලේ එක් තැනක හමුවන ගල් පාලම්ද සුවිශේෂි නිර්මාණයකි.

මෙහි ඇති "මහ ලෙන" නමින් හඳුන්වන ලෙන සංරක්ෂණයේදී ඉන්දීය පුරා විද්‍යාඥයන්ගේද සහාය ලබාගෙන ඇති අතර ඒ ප්‍රාග් ඓතිහාසික තොරතුරු ගවේෂණය සඳහාය. එමගින් වසර 3000-7000 ත් අතර ඉපැරණි ඓතිහාසික තොරතුරු ලැබී ඇත.


මෙයට අමතරව තවත් සංරක්ෂණය කිරීමට ඇවැසි දේ බොහෝය. මෙම ස්ථානය නැරඹීමට එන ජනතාවගේ පහසුව සඳහා තවත් යටිතල පහසුකම් රැසක් සපුරා ඇත. ඒ අතර රථගාල්, තොරතුරු මධ්‍යස්ථාන ආදියද ඇතුළත්ය.




ගල් පාත්‍රයක්



SPECIAL OFFER



# ELLA TOUR





**LKR 8,500 PER PERSON PER NIGHT**

- Minimum 10 pax
- Conditions apply offer valid till end of October 2020

## Package Including:

- Hotel accomadation on full board basis
- Nine Arches Bridge Tour
- Little Adam's peak Hiking
- Ravana Falls
- Colombo to hotel return transfer on A/C vehicle

Please Contact us for further details,
Eranga - 0772672970
Lakmali - 0773572835
Roshadi - 0773561210

Ceylon Shipping Lines Travels,
No. 450, D.R. Wijewardana Mawatha,
Colombo 10.
Tel: 011 - 2689500 - 8

CSL TRAVELS






# අලංකාරයත් තාක්ෂණයත් එක් තැන් කළ අළුත්ම කැලණි පාලම

**කොළඹ නගරයට ඇතුළු වන ප්‍රධාන කපොල්ලක් වූ පෑලියගොඩ නගරයේ පිහිටි නව කැලණි පාලම අතිශය ජනාකීර්ණ ස්ථානයකි. ලංකාවේ හරි අඩක් වූ පාරවල් වලින් කොළඹට පැමිණෙන සියලූ ජනී ජනයා මෙම පාලම පසුකර නගරයට ඇතුළුවන බැවින් එහි ඇති වාහන තද බදය අධිකය. අධිවේගී මාර්ගය ඉදිවීමත් සමග මෙම ස්ථානයේ ඇති වාහන සංඛ්‍යාව අති මහත්ය. ඒ සඳහා නව විකල්පයක් වශයෙන් අධිවේගී මාර්ගයට සම්බන්ධ වන නව පාලමක් මෙම ස්ථානයේ ලඟි ලඟියේ ඉදිවෙමින් පවතී.**

දැනට මෙහි ඇති නව කැලණි පාලම ඉදිවූයේ 1954දීය. වර්තමානයේ ඉදිවන නව පාලම ඊටත් ඉහළින් මන්තීරු හයක පාලමකි. අති නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් ඉදිවන මෙය අලංකාරය අතින් ඉහළ වැදගත් කමක් ගන්නා අතර ගඟ මැද ආධාරක කණු කිසිවක් නොතිබීම තවත් එක් විශේෂත්වයකි.

මුලින්ම මෙම ස්ථානයේ 1822 දී පමණ පාරු පාලමක් ඉදිවිය. ගඟ හරහා එගොඩ මෙගොඩ යා වන ලෙස පාරු එක පෙලට නවතා ඒ මතින් ලෑලි තට්ටුවක් සවි කර එහා මෙහා යැමට සැලස්වීමයි. බර වාහන වශයෙන් එකල පැවතියේ කරත්ත හා අශ්ව කෝච්චියයි.ඒ වාහන දෙකම මේ මතින් එහාට මෙහාට යැමට මින් හැකි විය.

1895 දී පාරු පාලමේ වුවමනාව අවලංගු කරමින් ප්‍රසිද්ධ වික්ටෝරියා පාලම ඉදි විය. යකඩින් තැනූ මේ පාලම 1959 දී කැළණිතිස්ස බලාගාරය අසල නව කැලණි පාලම ඉදිවන




තුරුම කොළඹ නගරයට ඇතුළු වන එකම ප්‍රධාන පාලම විය. එය 1994 දී වැඩ අරඹා 200 වසරේදී වැඩ අවසන් වූ ජපන් මිත්‍රත්ව පාලම ඉදි කිරීමේදී ගලවා ඉවත් කරන ලදී. කෙසේ වූවත් නුවර පාරේ සිට අප නිතර යනෙන කැළණිතිස්ස බලාගාරය අසලට මෙගොඩ වන පාලම ඇරඹුණේ 1956 දීය. එංගලන්ත සමාගමක් විසින් ඉදි කෙරුණු මෙම පාලම 1959 දී සම්පූර්ණ කර මහජන අයිතියට පත් කෙරිණ. පොදුවේ තවමත් නව කැලණි පාලම යනුවෙන් හඳුන්වන්නේ මේ පාලමය. අලූත් කැලණි පාලම ඉදිවන්නේ මේ පාලමට ආසන්නයෙහි ය.

1959 දී වැඩ නිම කෙරුණු නව කැලණි පාලමේ පළමු ප්‍රතිසංස්කරණය සිදු කළේ 1994 වසරේදී ය. එවකට තිබුණු විශාලතම පාලම කැලණි පාලමයි. 1994 වර්ෂයේ දී සිදු කෙරුණේ පාලමේ බෙයාරින් මාරු කිරීමය. ඒ කාලයේ හැටියට එය අපේ රටට අලූත් අරුම පුදුම ප්‍රතිසංස්කරණයක් විය.

උෂ්ණත්වය ඉහළ ගිය විට පාලමේ දිග මදක් වැඩි වේ. කොන්ක්‍රිට් වුවද ඉතා කුඩා ප්‍රමාණයකින් ප්‍රසාරණය වෙයි. එමෙන්ම පරිසර උෂ්ණත්වය මදක් පහල ගියේ නම් පාලමේ දිග ඉතාම කුඩා ප්‍රමාණයකින් අඩු වන්නට පටන් ගනී. මේ දිගෙහි සිදුවන වෙනස් කම් කෙතරම් කුඩා වුව ද කොන්ක්‍රීට් යෝධයාගේ ඉරි තැලීම් ඇති නොවී සනීපෙන් තබා ගැනීමට නම් පාලම් බඳට ආධාරක කුලූණු මත මඳ වශයෙන් එහා මෙහා යැමට ඉඩ සලසා තිබිය යුතුය. මේ කටයුත්ත පැවරෙන්නේ ‘බෙයාරින්’ නම් වූ නිමවුම් වලටය.

කැලණි පාලම ලෙඩවී ඇත්තේ මෙකී ‘බෙයාරින්’ වල ක්‍රියාවලිය නැවතීමෙනි. කොටින්ම උෂ්ණත්වයේ සිදුවන වෙනස්වීම් වලට අනුව පාලම් බඳේ එහා මෙහා සිදුවන චලනයන් නැවතීමෙනි. මෙය පසුවට භයානක ප්‍රතිඵල අත්කර දිය හැකි නිසා ‘බෙයාරින්’ අලූතෙන්න දැමීම හෝ අලූත් වැඩියා කිරීම කළ යුතුමයි. අනෙකුත් අලූත් වැඩියා කිරීම් කීපයක්ද සමග කැලණි පාලමේ දැනට



සිදු කරමින් පවතින්නේ ද එයමයි.

## ශ්‍රී ලංකාවට අලූතින්ම හඳුන්වා දෙන එක්ස්ට්‍රා - ඩෝස්ඩ් (Extra-Dosed) පාලම්

අප සාමාන්‍යයෙන් පෙර සවි කොන්ක්‍රීට් බාල්ක (beam) යොදාගෙන හෝ ඝනකම කොන්ක්‍රීට් තට්ටුවක් යොදාගෙන හෝ මෙම පාලම ඉදි කරන්නේ නම් ඉතා ළඟින් ආධාරක කණු ඉදි කිරීමට හෝ පලංචි ගැසීමට හෝ සිදු වෙයි. එහෙත් එක්ස්ට්‍රා-ඩෝස්ඩ් පාලම ඉදි කිරීමේදී ආධාරක සපයා ගන්නේ සවිමත්ව ඉදි කළ අට්ටාල කුළුණුවලින්ම නිසා පොළොවේ සිට ඉහළට ඉදි කරන ආධාරක හෝ පලංචි හෝ ඕනෑ වන්නේ අවම වශයෙනි.

මේ ආකාරයේ පාලම් තවමත් ලොව පුරා ඉදි කර ඇත්තේ සීමිත ගණනකි. මේ පාලම් වර්ගය පෙර සවි කොන්ක්‍රීට් බාල්ක යොදා ඉදි කෙරෙන පාලම් ක්‍රමය හා නූතන කේබල් පාලම් තාක්ෂණයේ මුහු වීමකි. අප මුලින් කී පළමු නව කැළණි පාලම (දැනට භාවිතයේ ඇති පාලම) ඉදි කර ඇත්තේ පෙර සවි කොන්ක්‍රීට් බාල්ක කුලූණු මතින් අතුරාය. එහෙත් ඒ ඉදි කිරීමේ දී ගඟ මැද විශාල කුලූණු තුනක් ඉදි කරන්නට සිදු විණි ඉන් සිදුවන ඉදි කිරීම් අපහසුව, පාරිසරික හානිය හා සෞන්දර්යාත්මක පෙනුමට ඇතිවන අවහිරය යන අවාසි තුනම නව ක්‍රමයෙන් මග හැරේ. කොටින්ම මේ ක්‍රමයෙන් අත්පත් වන ප්‍රමුඛම වාසිය නම් මීටර් 180ක් පමණ විශාල දුර පරාසයකින් යුත් කුලූණු දෙකක් මත පාලම ඉදිකරන්නට පුළුවන්වීමය.

ඒ නිසා ගඟ මැද කුලූණු ඉදි කරන්නට වුවමනා වූයේ නැත. ගඟ මැද යම් ඉදි කිරීමක් කරන්නේ නම් විශාල හිරිහැර වලට මුහුණ දෙන්නට සිදුවෙයි. ඒ ගඟේ වෙනම ඉදිකිරීම් කොටස් සකස් කිරීම හා වතුර බැස්සවීම අවදානම් සහගතව කම්කරුවන් සේවයේ යෙදවීමට සිදුවීම ආදියයි. ඊ ළඟට “දීර්ඝකාලීනව ගඟේ ස්වාභාවික ගැල්මට හා පෙනුමට සිදුවන අවහිරයද ඉමහත්ය.

පාලම් බඳ ඉදිකරනු ලබන්නේ ප්‍රධාන ආධාරක අට්ටාලයෙන් (pylon) දෙපසට විහිදෙන කුරුපා හෙවත් කැන්ටි ලීවර කොටසම් වශයෙනි. පළමු කුරුපා කොටස් දෙක පයිලන් කුලූනටම සම්බන්ධිතව ඉදිවේ. (පහත රූප සටහනේ තද කළු පැහැයෙන් තිරස්ව දක්වා ඇති කොටස්). අනතුරුව එක පයිලන් කුලූනකින් ගඟ මධ්‍ය දෙසටමීටර් 90ක් දිග කුරුපා කොටසක් බැගින් කුලූනු දෙකෙන්ම කැන්ටි ලීවර කොටසේ දිග වැඩිවන ලෙස පාලම් බඳ ඉදිවී ඒවා ගඟ මධ්‍යයේදී (ගඟට ඉහළින්) එකිනෙක හමු වෙයි.

14 වෙනි පිටුවට...

# අපේ රටේ සත්ව ගහනය මිනිස් ගහනය නැති කරයිද ?





දැන් වන විට ලංකාවේ විශාල ආහාර හිඟයක් ඇති වී ඇත. ඕනෑම භෝගයක් වැවෙන ලංකා භූමියේ ආහාර හිඟවීම ඇදහිය නොහැක්කකි. ඒ වගේම ගොවියාගේ දරිද්‍රතාවය ඉහළ යමින් පවතී. මෙයට ප්‍රධාන හේතුවක් බවට පත්වී ඇත්තේ වන සතුන් ගම් වැදීමයි.

කැළෑ ප්‍රදේශවලට සීමාවී සිටින වන සතුන් විශාල වශයෙන් දැනට වසර හත අටක සිට ගම්මාන ආසන්නයේ දැඩිව බෝවී ඇත. වල් ඌරන් දඩු ලේනන් රිළවුන් වඳුරන් මොනරුන් ඉත්තෑවන් විශාල රංචු වශයෙන් ගම්මාන අවට සැරිසරමින් වගා භූමි වනසති. මීට අමතරව අලින්ගෙන් සිදුවන වගා විනාශය ජාතික මට්මමෙන් කතාවෙන තැනට පත්වී ඇත.

වන භූමි හිඟව පවතින බැවින් මෙම සතුන්ට සිටීමට ස්ථාන හා ආහාර හිඟවී ඇත. ඒ නිසා මොවුන් ගම් වදිති. ගම් වදින මේ සතුන් ඔවුන්ගේ ආහාරය සඳහා යොදාගන්නේ ගොවීන්ගේ වගාවන්ය. ගොවීන් වගා කරන්නේ මිනිස් පරිභෝජනය සඳහාය. එවිට මිනිසාට ආහාර හිඟයක් ඇතිවීම ස්වාභාවික වන අතර ආහාර මිල ඉහළ යාමද වැළක්විය නොහැක.



එසේම කුඩා පරිමාණයේ වගාකරුවන් වගාව අතහැර දැමීමට කටයුතු කරයි.

වියළි කලාපයට පමණක් සීමාවී සිටි මොනරා මේ වන විට තෙත් කලාපය හා අතර මැදි කලාපයේ ද ව්‍යාප්ත වී සිටිති. එය පාරිසරික දේශගුණික විපර්යාසයක් රටේ සිදුවන බවටද හොඳ සාධකයකි. මොනරුන් නිසා ගොවියෙකු සිය දිවි හානිකරගත් අවස්ථාවක්ද ගලෙන්බිඳුණුවැව ප්‍රදේශයෙන් වාර්තා විය. එම ගොවියාගේ කුරහන් හේනට මොනර රංචුවක් සිදු කළ විනාශය දරාගත නොහැකි වූ ගොවියා ගිනි තියාගෙන මිය ගිය බවට වාර්තා විය.

දැදිගම ප්‍රදේශයේ පාන්දරට පාරවල් වල පොලිස් මුර යෙදීමට සිදුවූයේ වල් ඌරන් නිසා පාන්දර ගමන් යන අයට තිබූ අපහසුව මග හරවා ගැනීමටය. මෙම සතුන් ගැවසෙන ප්‍රදේශවල කිසිඳු ගොවිතැනක් කරගත නොහැකි තත්වයක් උදාවී ඇත. මෙම සත්ව ගහණය දිනෙන් දින වැඩිවෙමින් පවතින තත්වයක් දැකිය හැක.


පෙර කාලයේ දඩයක්කරුවන් රටේ බහුලව සිටිහය. එහෙත් වර්තමානයේ දඩයමට හා සත්ව හිංසාවට බහුතර ජනයා එතරම් කැමැත්තක් නොදක්වති. මෙයද සත්ව ගහනය වැඩිවීමට හේතුවක්වී ඇත. සත්ව ඝාතනය හා සත්ව හිංසනය අපි කාටත් අනුමත කළ නෙැහැකි බව ඇත්තකි. සතුනුත් ජීවත් වී මනුශ්‍යයාත් ජීවත් වීමේ වැඩපිළිවෙළක් රටට අවශ්‍යය.

**වන භූමි හිඟව පවතින බැවින් මෙම සතුන්ට සිටීමට ස්ථාන හා ආහාර හිඟවී ඇත. ඒ නිසා මොවුන් ගම් වදිති. ගම් වදින මේ සතුන් ඔවුන්ගේ ආහාරය සඳහා යොදාග න්නේ ගොවීන්ගේ වගාවන්ය. ගොවීන් වගා කරන්නේ මිනිස් පරිභෝජනය සඳහාය. එවිට මිනිසාට ආහාර හිඟයක් ඇතිවීම ස්වාභාවික වන අතර ආහාර මිල ඉහළ යාමද වැළක්විය නොහැක.**

කොබ්බෑකඩුව ගොවි පර්යේෂණායතනය පවසන පරිදි මෙරට ආහාර නිෂ්පාදනයෙන් 40% ක් සතුන්ගෙන් විනාශ වේ. සතුන් නිසා විනාශ වන ප්‍රමාණයට අමතරව වැස්ස අවුව වැනි ස්වාභාවික විපර්යාස හා නාස්තිය නිසාද තවත් 25-30% ක් ප්‍රමාණයක් නිෂ්පාදනයෙන් ඉවත්වෙයි. ගොවියාට ඉතිරි වන්නේ 30% ටත් අඩු ප්‍රමාණයකි. මෙම ප්‍රමාණයෙන් නිෂ්පාදකයා සිය වියදම හා ලාභය උපයා ගත යුතුය. එය කළ හැක්කක් නොවේ. අවසානයේ ගොවියාත් පාරිභෝග කයාත් යන දෙදෙනාම අන්ත දරිද්‍රතාවයට පත්වීම වැළක්විය නොහැක.

මෙම වන සතුන් අභයභූමි තුළට කොටුකිරීමට ක්‍රමයක් ඇත්නම් ජනතාවට විශාල සහායක් වනු ඇත. ගම් මට්ටමට සේන්දුවී ඇති මෙම සත්වයන් අල්ලා අභයභූමි වලට ගෙනයෑමේ කඩිනම් වැඩපිළිවෙලකට රජය ඉක්මනින් යායුතුව ඇත.






---

13 වෙනි පිටුවෙන්...

## අලංකාරයත් තාක්‍ෂණයත් එක් තැන් කළ අළුත්ම කැලණි පාලම ....

අවසානයේ ප්‍රධාන කුලුනු දෙක අතර මුලු පාලම් බඳෙහි දිග මීටර් 180ක් වන්නේ මීටර් 90 කොටස් දෙකක් හාවීමෙනි. ප්‍රධාන පයිලන් කුලුණු දෙකෙහි සිට ගොඩබිම පැත්තට වන්නට තිබෙන ඊළඟ කුලුනු දෙකට දුර මීටර් සියයක් බැගිනි.

මෙසේ ඉදිවන පාලම් බඳ කොන්ක්‍රීට් කරනු ලබන්නේ තිරස් අතට චලනය කළ හැකි ෂටරිමක් (Form traveler) යොදාගෙ නය. පළලින් මීටර් 30ක් පමණ ද, උසින්මීටර් දෙක හමාරක් හා දිගින් මීටර් හතරක් පමණ දවන කොටසම් ලෙස නිමවනු ලබන පාලම් බඳට අයත් එක් එක් කොටස එකිනෙක යා කෙරෙන්නේ පසු සවි (post-tensined) ක්‍රමයටය. (පෙර හා පසු සවි ක්‍රම යනු මොනවාදැයි යන්න කොටු තුළ පැහැදිලි කර ඇත).



මෙසේ ඉදි කෙරෙන ඒකක කොටස් කේබල් මාර්ගයෙන් පයිලන් කුලුනු හා සම්බන්ධ කර රඳවා ගනියි. බර දරා ගන්නේ එම අට්ටාලයෙන් ඇදෙන රැකුල් කේබල් වලිනි. මේ විශාල කේබල් ස්ථිරවම පාලමේ රඳවා තිබෙන අතර, මේ ක්‍රමයේදී එල්ලෙන කේබල් පාලම් වලට මෙන් ඉතා උසට පයිලින් ඉදිකරන්නට අවශ්‍ය නොවේ. ඒ එක්ස්ට්‍රා-ඩෝස්ඩ් පාලම් වල විශේෂත්වයකි.

මෙසේ සම්පූර්ණ වූ ප්‍රධාන පාලම ගඟෙන් ඉවත දෙසට දෙපසින් ඇති කොටස් ද සමග සලකන කල දිගින් මීටර් 380ක් පමණ වේ. (රූපය බල්න්න) ගඟ දෙපස වූ විශාල අට්ටාල (පයිලින්) දෙකක් මත සමබර ව රඳවා තිබෙන ලෙසින් දිස් වන බැවින් මෙය සමබර කුරුපා පාලමක් ලෙසින් ද හැඳින්වේ. පාලමේ පෙනුමද සිත් ගන්නා සුලුය. නවීන නගර සැලසුම් වලට සරිලන සෞන්දර්යාත්මක පෙනුමක් ද ලැබෙන නිසා ඉන් කොළඹ නගරයට නවීන අලංකාර පෙනුමක් ලබා දෙනු ඇත.




# DAMBULLA

## 1 NIGHT / 2 DAYS

Rs. 9,800 PP on Double room sharing

Rs. 8,700 PP on Triple room sharing


Rs. 8,200 PP on Family room sharing

(Minimum 10 pax required)

*Package Including*

- ✓ Accommodation on Full Board Basis
- ✓ Air conditioned transport from Colombo & return
- ✓ Pidurangala or Sigiriya Tour

**Conditions apply**








Call us now,
Ceylon Shipping Lines Travels
No. 450, D.R. Wijewardena Mawatha,
Colombo 10
Tel : 011 - 2689500 - 8

Eranga : 077 267 2970
Lakmali : 077 357 2835
Roshadi : 077 356 1210

CSL TRAVELS





# දොළොස් වසරක් පුරා ISO ප්‍රමිති සහතිකයෙන් පිදුම් ලබන

# සිලෝන් ෂිපිං ලයින්ස් භාණ්ඩ නිශ්කාෂන මධ්‍යස්ථානය

ලොව පුරා විහිදී ඇති ජාත්‍යන්තර ප්‍රමිති ආයතනය හෙවත් **ISO** ආයතනය ලොව සෑම රටක්ම පිළිගත් ආයතනයකි. මෙම ආයතනය මගින් සිදුකරන්නේ ලොව ඇති රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා ප්‍රමිති සහතික නිකුත් කිරීමයි. මෙම ආයතනය මගින් ප්‍රමිති සහතිකය දිනා ගැනීම සුළුපටු කාර්යයක් නොවේ. එවැනි ආයතනයන්හි ඉහළ කළමනාකාරිත්වයේ සිට පහළම සේවකයා දක්වා තම තමන්ගේ කාර්යභාරය පමණක් නොව ලිපි ලේඛන පවා ජාත්‍යන්තර මට්ටමින් ලොව පිළිගත් පිළිවෙළට පවත්වාගන යායුතුය.

මේ සියලු අංශයන් නිසි පරිදි ඉටුකිරීම පිළිබඳ දීර්ඝ විමර්ශනයකින් පසු 2009 වසරේදී සිලෝන් ෂිපිං ලයින්ස් නිශ්කාශන ආයතනයට **ISO** ප්‍රමිති සහතිකය හිමිවිය.

එම සහතිකය ප්‍රකාරව තත්ත්ව පාලන ප්‍රතිපත්තියක් හා දැක්මක් ප්‍රකාශයට පත්වී ඇත. ඒ අනුව අපගේ තත්ව ප්‍රතිපත්තිය නම් අපගේ පාරිභෝගිකයින් ගේ හා සේවාලාභීන්ගේ අවශ්‍යතාවයන් හා අපේක්ෂාවන්ට ගෙවන මුදලට සරිලන කාර්යක්ෂම උසස් තත්වයේ සේවාවක් ලබාදෙමින් දේශීය හා විදේශීය වෙළඳපලේ කීර්තිය දිනා ගත් මගී ගමන් බඩු නිශ්කාශන හා ගුදම් ගත සේවාවක් ජාත්‍යන්තර අනර්ඝතම මට්ටමට අනුව පවත්වාගෙන යාම අපගේ ආයතනයේ ප්‍රතිපත්තිය වේ.

පාරිභෝගික තෘප්තිය හා නිරන්තර වැඩිදියුණුව ඇතිකරමින් පද්ධතිය තුළ මනා තත්ව කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කර ඇති අතර නිවැරදි කිරීමේ හා වළක්වා ගැනීමේ ක්‍රියා මාර්ග මගින් තත්ව පද්ධතියේ කාර්යක්ෂමතාවය නිරන්තරව වැඩි දියුණු කරනු ලබන අතර අභ්‍යන්තර හා බාහිර විගණනය නිරන්තරව සිදුවෙයි.

තත්ව ප්‍රතිපත්තියට අමතර තවත් ප්‍රධාන අරමුණු තුනක් ඇත. එනම්

1. භාණ්ඩ හැසිරවීමේදී සිදුවන හානිය 2.5% දක්වා අඩු විය යුතුය. එනම් පාරිභෝගිකයාගේ භාණ්ඩ සඳහා 97.05% ක ආරක්ෂාවක් සහතික විය යුතුය. ඉතාමත් පරිස්සමින් හා ආරක්ෂාකාරී ලෙස කටයුතු කළයුතු වීම එක් ප්‍රධාන අරමුණකි.

2. පාරිභෝගිකයා සඳහා සිය සේවාවන් ඉටු කිරීමේදී ගතවන කාලය විනාඩි 9 ක තරම් සාමාන්‍ය අගයක් පවත්වාගත යුතුව ඇත. සිලෝක් ෂිපිං ලයින්ස් භාණ්ඩ නිශ්කාෂන මධ්‍යස්ථානයට සේවා ලබා ගැනීමට එන ඔබට ඔබගේ භාණ්ඩ ඔබ අතට පත් වන විට ප්‍රධාන සේවා කවුළු තුනක් පසුකර යා යුතුය. ඒ ඒ ස්ථානවලදී අදාල රාජකාරී සිදුවෙයි. ඒ අනුව විනාඩි 30 ට අඩු කාලයකදී ඔබට සිය සේවාවන් ඉටුවනු ඇත.

3. පාරිභෝගික පැමිණිලි 5% දක්වා අඩුකර ගැනීම සිලෝන් ෂිපිං ලයින්ස් නිශ්කාශක මධ්‍යස්ථානයේ තවත් එක් ප්‍රධාන අරමුණකි.

ඕනෑම සේවා ස්ථානයකින් සේවා සැපයීමේදී පාරිභෝගිකයින් ගේ පැමිණිලි නිරන්තරයෙන් ලැබෙනු ඇත. එසේ වන්නේ ආයතනික දුර්වලතා හේතුවෙනි. එහෙත් **ISO** 9001:2015 තත්ත්ව සහතිකය යටතේ එවැනි අඩුපාඩු තබා ගත නොහැකි. එලෙස පාරිභෝගික පැමිණිලි 5% ට වඩා අඩුවෙන් තිබිය යුතුය. එසේ පවත්වාගෙන යෑමට කාර්ය මණ්ඩලය උපරිම කැපවීමෙන් කටයුතු කරති.

එසේ ජාත්‍යන්තර පිළි ගැනීම ලැබීමෙන් පසුද එම තත්ත්වයෙන්ම සිදුවන්නේද යන්න ජාත්‍යන්තර ප්‍රමිති ආයතනය ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය හරහා පසු විපරම් සිදු කරයි. වසර තුනකට වරක් මෙම සහතිකය නිකුත් කරන අතර එම කාලය තුළ ද වසරකට වරක් පූර්ණ අධීක්ෂණයට භාජනය කිරීම සිදුවෙයි. මීට අමතරව ආයතනය මගින් වෙනම කාර්ය මණ්ඩලයක් යටතේ අභ්‍යන්තර විගනනයක් නිරන්තරයෙන් සිදුකරති.

මෙවැනි කඩඉම් රැසක් පසුකර ලබා ගත් **ISO** 9001:2015 ප්‍රමිති සහතිකය ඊළඟ වසර සඳහාද රැක ගැනීමට නම් එම මට්ටමින්ම ආයතනය පවත්වාගෙන යෑම ආයතනයේ වගකීමයි.

සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් නිශ්කාෂන මධ්‍යස්ථානය එලෙස අඛණ්ඩව වසර 12 ක් පුරාවට **ISO** ප්‍රමිති සහතිකය ලබාගත් ආයතනයක් වීම විශිෂ්ටය.

ප්‍රධාන වශයෙන් මෙම ආයතනයට පැමිණෙන්නේ විදේශගත වූ ලාංකිකයින් එම රටින් ලංකාවට ගෙන ආ බඩු භාණ්ඩ නිදහස් කරගැනීම උදෙසාය.

ඒ පිරිස් අතර තම භාණ්ඩ නිදහස් කරගැනීම පිළිබඳ අවබෝධය ඇති අයත් නැති අයත් සිටිති. මේ සැමටම ඒක සමාන ලෙස සේවා සහ පහසුකම් සැපයීම ආයතනයේ හා සේවක සේවිකාවන්ගේ වගකීම හා යුතුකම වනු ඇත.

පළමුව මෙම ස්ථානයට පැමිණෙන සේවාලාභියාට අනු පිළිවෙලින් අංකයක් ලැබෙන අතර ඒ අයගේ විදේශ ගමන් බලපත්‍රය හා අදාළ ලේඛන ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආයතනික සේවක සේවිකාවන් අතින් ඉතිරි රාජකාරී සියල්ල සිදුවෙයි.

අදාළ පත්‍රිකා පුරවා තමාට අයත් භාණ්ඩ හෝ බඩු පෙට්ටි නිසි ලෙස හඳුනාගැනීම සිදුකිරීමෙන් අනතුරුව භාණ්ඩ නිදහස් කරගැනීමේ ලේඛනය අදාළ පුද්ගලයා වෙත ලැබෙනු ඇත. මේ සඳහා ගතවන උපරිම කාලය විනාඩි 30 ක් තරම් කෙටි කාලයකි.

විදේශ රටක සිට එන භාණ්ඩ පෙට්ටි දහස් ගණනක්, සේවාලාභීන් දහස් ගණනක් අතුරින් තම භාණ්ඩ නිසි ලෙස හඳුනාගෙන නිසි ආරක්ෂාව යටතේ නීත්‍යානුකූල ලියවිලි රැසක් නිසි ප්‍රමිතියට සකස් කොට සේවාලාභියා ගේ මූලික අවශ්‍යතාව විනාඩි 30 තරම් කෙටි කාලයකින් ලබාදීම යනු සුළු පටු කාර්යක් නොවේ. මෙම කාලය තුළ සිදුවන සියලු ක්‍රියා කාරකම් සඳහා සේවාලාභියා කිසිඳු වෙහෙසකට පත්වීමට ඉඩ නැත. ඔහුට ඇත්තේ නම සහ අංකය කියා අමතන තෙක් බලා සිටීම පමණි.

ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතුව සේවාලාභියාට උපරිම සේවාවක් ලබාදීම තුළ සැමවිටම සිදුවන්නේ සේවාලාභියාගේ අවශ්‍යතාව ඉතා ඉක්මනින් හා නිවැරදිව ඉටුකර දීමයි.


ඊළඟට සේවාලාභියා ගේ භාණ්ඩ සඳහා ආයතනය පූර්ණ ආරක්ෂාව සලසයි. යම් විදියකින් කුමන හෝ කැඩීමක් බිඳීමක් හානියක් සිදුවී ඇත්නම් ඒ සඳහා රක්ෂණ ආයතනයේ නීති හා රෙගුලාසි වලට යටත්ව පූර්ණ රක්ෂනාවරණයක් හිමි වනු ඇත. තමා ඉදිරිපිට සියලු භාණ්ඩ රේගු පරීක්ෂාවට ලක්වන අතර එවැනි හානි පැමිණිලි යම් භාණ්ඩ සඳහා ඇත්නම් ඒ ගැන අවස්ථාවේදීම පැමිණිලි කළ යුතුය.

සේවා ලාභියා කුමන හෝ ආපහසුතාවකට පත් නොවන අයුරින් සියලු සේවාවන් ඉටුකර දීමේ පූර්ණ වගකීමෙන් යුක්තව කටයුතු කිරීම සිලෝන් ෂිපිං ලයින්ස් සමාගමේ පරමාදර්ශය වන අතර ඒ නිසාම අඛණ්ඩව **ISO** 9001:2015 ජාත්‍යන්තර ප්‍රමිති සහතිකය මගින් පෙන්නුම් කරන ප්‍රමිතිය පවත්වා ගැනීම සිදුකරයි. ලොව කොතනක හෝ රටකදී ඉතා උසස් තත්ත්වයේ භාණ්ඩ නිශ්කාශන ආයතනයකට ඔබ ගිය ද එම තැනකින් ලැබෙන උපරිම සේවාව ඔබට ශ්‍රී ලංකාවේදී සිලෝන් ෂිපිං ලයින්ස් භාණ්ඩ නිශ්කාශන මධ්‍යස්ථානයේ දීද හිමි වනු ඇත.

දැනට ලංකාවේ ඇති **ISO** සම්මානය දිනාගත් එකම භාණ්ඩ නිශ්කාශන සමාගම බවට පත්වී ඇත්තේද සිලෝන් ෂිපිං ලයින්ස් නිශ්කාෂන මධ්‍යස්ථානයයි.






**SPECIAL OFFER**

**LKR 10200**

(Per Person Rate)

*Conditions:*

*Minimum 10 pax required*
*offer valid till end of November 2020*

- **Hotel accomadation on half board basis**
- **Waterfall Site Tour**
- **Colombo to hotel return transfer on A/C vehicle**





Call us now,
Eranga - 0772672970
Lakmali - 0773572835
Roshadi - 0773561210

Ceylon Shipping Lines Travels,
No. 450, D.R. Wijewardana Mawatha,
Colombo 10.
Tel: 011 - 2689500 - 8

CSL TRAVELS

** Conditions Apply**

ස යු රේ න්
එතෙර
එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය

# කොරෝනා සොබාදහම දුන් දඬුවමක්ද?

සෑම සත්වයෙකුටම තමා උපන් ප්‍රදේශය තුළ මීටර් දෙතුන් සීයක වපසරිය තුළ සිය ජීවිකාව පවත්වාගත හැකි ලෙස සොබාදහම නිර්මාණය වී ඇත. එම නීතිය මිනිසාටද එසේමය. මිනිසාගේ දැනුම සිතුවිලි පරම්පරාවල පැතිරීමේ ස්වභාවයත් සමඟ මිනිසා මෙම නීතිය අනුගමනය කරන්නේ නැත. විශේෂයෙන් මිනිසාද එම ස්වභාවධර්මයේ තිබෙන ක්‍රමයෙන් බැහැරව යන්නට පටන් ගෙන වැඩි ඈත කාලයක් නොවේ. මිනිස් අවශ්‍යතාවන් වැඩිවෙත්ම මිනිසා ස්වභාවධර්මයේ මෙම රීතිය වෙනස් කළහ.

කාර්මික විප්ලවයෙන් පසු මේ වෙනස්වීම සීඝ්‍රයෙන් සිදුවිය. වර්තමාන නගරවල මීට වසර හැට හැත්තෑවකට එපිට ජනයා ජීවත්වූයේද සිය පදිංචි ස්ථානය හෝ එම ප්‍රදේශය කේන්ද්‍රකරගෙනය. අදටද පිටිසර ගම්මානවල මිනිසුන් ජීවත් වන්නේ එලෙසය.

ඔවුන්ට සංකීර්ණ අවශ්‍යතා නැත. වත්තෙන්, කුඹුරෙන්, අවට මුඩුබිම්, බඩවැටි, වන රොදවල් වල ඇති ගහ කොළ එල ඔවුන්ගේ ආහාරය පමණක් නොව ඖෂධ ද සපයා ගනී. නිරෝගී ජීවිතයක් ගත කරන මොවුන්ට යාන වාහන, දුරකථන, අන්තර්ජාල, තොරතුරු තාක්ෂණය, දුර බැහැර සංචාර, ඉද හිට "ෆන්" එකක්, ප්‍රයිඩ් රයිස්, කොත්තු, පීසා අවශ්‍ය නැත. ආතතිය පීඩනය ඒවාද නැත. ජීවිතය ඉතා සැහැල්ලුය. ප්‍රෙෂර්, ෂුගර්, කොලෙස්ටර්රෝල් ද නැත. ඔවුන් පරම ලාභය ලබති. ඒ නිසා බොඩි චෙකප් අවශ්‍ය නොවේ. අවශ්‍යතාවන් අඩු නිසා පරම ධනය වූ සතුට ඔවුන්ට ඇති බැවින් ඉද හිට "චේන්ජ්" එකක් වෙනුවෙන් "ෆන්" එකක් වෙනම ගැනීමට අවශ්‍යය නැත.

නූතන ලිබරල් වෙළඳ රටාවකට හසුවී ගසාගෙන යන මිනිසාට මුදල පරම ධනය වූ බැවින් ඒ වෙනුවෙන් ඕනෑම දෙයක් කරති. මිනිසාට පරිසරය අවශ්‍යම නැත. තවත් කෙනෙකුට තවත් කෙනෙක් අවශ්‍ය නැත. නෑදෑකම්, හිත මිත්‍රකම්, අසල්වාසී කම්, අසරණකම් අදාළම නැත. එහි උච්චම තැනට දැන් පැමිණ ඇත.

ලෝක ධනවතුන් බලවතුන් බවට පත්විය. ඔවුන් බලවතුන් වූයේ අනුන් මරන්නට අවි තනාය. පරමාණු බෝම්බ න්‍යෂ්ටික බෝම්බ ඇතුළු සමස්ත පෘථුවි තලයම එකවර පුපුරවා හැරිය හැකි අවි තැනුවේ තවත් මිනිස් සමූහයකට එරෙහිවය. පෘථුවිය අතික්‍රමනය කළ ඔවුහු දැන් අභ්‍යාවකාශය ද තරණය කරති. හද මත පය තැබීම. අඟහරුගේ පාෂාන ගෙන ආවේය. දැන් පිටසක්වලින් එන ප්‍රහාරවලට මුහුණ දෙනහැටි සැලසුම් කළහ.

මේ වනවිට ඒ සියලු ප්‍රයත්නයන් නිශ්ඵල වී ඇත. සියලු ධනවතුන් සියලු බලවතුන් කොරෝනා ගෙවල් තුළට කොටුකළහ. පරමානු න්‍යෂ්ටික අවි වලින් කොරෝනාවට පහර දිය නොහැක. හඳට ගිය ගමනින් දැන් ප්‍රතිඵලයක් නැත. අන්තර්ජාලය තොරතුරු තාක්ෂණයෙන් දැන් දැනගත හැක්කේ ආසාධිතයින් හා මරණ සංඛ්‍යාවන්ය. ලෝක බලවතුන් ගේ සල්ලි වලට හෝ අවි ආයුධ වලට කොරෝනා පාලනය කළ නොහැක. කොරෝනා පාලනය කළ හැක්කේ ජනතාව මීටර් දෙතුන් සියයකට දුරකට කොටුවී ස්වභාවධර්මයේ රීතියට හැඩ ගැසුණොත් පමණය.

මෙතෙක් කල් මිනිසුන් සතුන් කොටුකළහ. අද වන විට සතුන් නිදහසේ ජීවිත ගෙවන අතර මිනිසා කූඩු වී සිටිති.

මෙතුවක් කල් ජනතාවට ඇඹුලට මඟුලට ගමට යෑමට ඉඩක් කඩක් තිබුණේ නැත. දෙමාපියන් දැකීමට ඥාති මිත්‍ර සබඳතා පැවැත්වීමට ඉඩක් නැත. හරි "බිසි" ය. ඒ නිසාම ආතතිය වැඩිය. ඒ තිබුණ කලබලය කොරෝනා විසින් සුණු විසුණු කළේය.

නිවාස අඩස්සියේ සිටින ලොව පුරා ජනයාට කොරෝනා ගැන සිතනවා නම් නොයෙක් ආකාර වලින් සිතා තේරුම් ගත හැකිය. මෙහි ඇත්ත යථාර්ථය තේරුම් නොගත්තාතාක් මෙවැනි උවදුරු වලින් ජය ගැනීමට මිනිසාට හැකි වන්නේ නැත.

ලංකාවේ අට දිසාවේ සිට පැරණි ගැමියන් සිරිපා මළුව වැද පුදාගත්තේ නිවෙස් වල සිටය. බොහෝ ප්‍රදේශ වලට දැකිය හැකි දසුනකි. එහෙත් මෑත කාලයක සිට සිරිපාදය නොපෙනී ගියේය. ඒ අලුදූවිලි ආදියෙන් වැසී තිබුණු බැවිනි. ඉන්දියාවේ හයිද්‍රාබාද් නුවර සිට එවරස්ට් කඳු මුදුනට ඇත්තේ කි.මී. 100 කි. වසර අසූවකට පසු හයිද්‍රාබාද් නුවරට එවරස්ට් කන්ද දකින්නට ලැබුණේ වායුගෙ ්ලයේ පිරිසිදු වීම නිසාය.

ලොව විශාල නගරවල තිබූ ඔක්සිජන් අලෙවිසැල් දැන් අවශ්‍ය නැත. වායු ගෝලය ඔක්සිජන් පරිමාව ඉහළ ගියේ වායුගෝලයට අපද්‍රව්‍ය එක්වීම නැවතුන නිසාය. නගරවල තිබූ කුණු ඇළවල් ක්‍රමයෙන් පිරිසිදු වෙමින් පවතී. ඉතාලියේ වැනිස් නගරයේ පිහිටා ඇත්තේ දියගල් මතය. එහි ජලය පිරිසිදුව ඇති අයුරු විදෙස් මාධ්‍යය ලොවටම පෙන්වා දුන්නේය.

හිරු එළියේ අපද්‍රව්‍ය කොටස් අවශෝෂණය වීම සඳහා සොබා දහමින් නිර්මානය වී ඇති ඕසෝන් ස්ථරය දිනෙන් දින සිදුරු වූයේ වායුගෝලයට එක්වූ අපිරිසිදු වාතය හේතුවෙනි. කාබන්ඩයොක්සයිඩ් කාබන්මොනොක්සයිඩ් කාබන් අංශු වැනි අපවිත්‍ර දෑ හේතුවෙනි. මේ නිසා ගෝලීය උෂ්ණත්වය ඉහළ ගියේ. ඕසෝන් ස්ථරය සිදුරු විය. ලෝකය "ලොක් ඩවුන්" වී මසක් ගත වන විට ඕසෝන ස්ථරයේ සිදුරු කුඩා වන්නට පටන් ගෙන ඇති ආකාරය ලෝක පරිසර සංවිධානය ලොවටම පෙන්වා දුන්නේය. යාන වාහන ගමනාගමනය නතර වී කර්මාන්තශාලා නැවතී තවත් මාස කීපයක් පැවතුනහොත් වායුගෝලීය උෂ්ණත්වය වුවද තරමක් අඩුවීම සිදුවනු ඇත.

මේ දිනවල මිනිස් ක්‍රියාකාරකම් 95% කින්ම නැවතී ඇති මොහොතක මේ පෘථිවි තලයම පාලනය කරන්නේ සොබා දහම විසිනි. වසර සියයකට අධික කාලයක සිට මිනිසා සොබාදහම පාලනය කළෝය. එම කාලය තුළ වැඩියෙන්ම සිදුකළේ සොබා දහමට අරියාදු කිරීමය. දැන් මේ වන විට සොබා දහම ලෝකය සියතට ගෙන ඇත. සොබා දහමේ පාලනය කාටත් පොදුය. අද සිටින සියලු මිනිස් වර්ගයා දැන හෝ නොදැන සොබා දහමට අරියාදු කර ඇත. ඒ ඒ අරියාදුවේ තරමට සොබා දහමද අපට සලකන බව ලෝකය පුරා කොරෝනා ව්‍යාප්ත වී ඇති ආකාරය විශ්ලේෂණය කිරීමේදී මැනවින් පෙනී යයි. මෙහිදී සොබා දහම සිය බලය උපරිමයට නොයදන බව ද පෙනේ.

දෛනිකව සිදුවන සත්ව ඝාතන යම් තරමකට අඩුවී ඇති බව පෙනේ. විවෘත්ත සමාජය තුළ මිනිසා සිදු කරන පාපක්‍රියා බොහෝ සෙයින් අඩු වී ඇත. එය ලෝකයට තරමක අස්වැසිල්ලකි. සොබා දහම හා ලගින් ඇසුරු කළ ඈත පිටිසර සරල දිවි ගෙවන ජනයාට කොරෝනා එතරම් බලපෑමක් සිදු නොකරයි. ඒ ඔවුන් ගෙන් සොබා දහමට එතරම් හානියක් සිදු නොවන බැවිනි. නාගරික පැලැන්තියේ ආර්ථිකය කරපින්නා ගත් සංකර සමාජ රටාව තුළ අධ්‍යාත්මික හැදියාවක් නැති ජීවිතයේ හරයක් නොදකින ජනයා කොරෝනා වෛරසයේ ගොදුරක් හෝ සිරකරුවෙක් බවට මේ වන විටත් පත්වී අවසානය.



# සිරි දළදා තෙදින් නමදිම් සිරස නමා

සුළඟේ ගලා එයි පෙරහැර සිරිය හමා
හැම හදවතක මුමුනන්නේ දහම අමා
සිරි සිදුහත් ගොයුම් ගොත්හිමි වැඩිය බිමා
සිරි දළදා තෙදින් නමදිම් සිරස නමා

ඇත් රජ පෙළින් ගරු බුහුමන් ලබන්නේ
බෙර මහ දවුල් හඬ පෙර කස පුපුරනනේ
සිහිගන්වමින් මහරජ නිලමේ යන්නේ
දැලේ රජිඳු සිරි දළදා වඩමන්නේ

මහනුවර භාරත රශ්මි

# නමදිමු දළදා වහන්සේ

ආතත විතත විතතාතත ඝණ සුසිර
යන මේ පංචතුර නද සැමදින පැතිර
දළදා මැඳුර කරඬුව රන්කොත සෙමෙර
සලමින් සිහිල ගෙන දේ සැමහට මිහිර

අලුයම් ධූර නහමින් හඬ පින් බරෙක
සැන්සෑධූර නගමින් හඬ සඳ බරෙක
මැඳුරෙන් සතර දිග නංවයි හඬ වරෙක
පොදු බැතිමතුන් පෙරහැර වන්දනාවක

ඒ චිත්‍රසේන බටපොල. පිළිමතලාව

# ගම්දොර

වනේ වන මලට තනියක්
බණේ තිබෙන හැටියට ඉමු අපි
ගුණේ වැඩි වෙවී සත්දම් රැක
සෙනේ බඳිමු හැමදා එක තැන

වැටකොළු මල් පිපෙන සවසට
වට පිල මත ඇසෙයි රස බස්
ගෙට දොර බැදන් පහනක් තැබූ විට
වට තිර සෙලවි සෙලවී නැටුවා

කන්දෙන් එබෙන හිරු දෙවියන්
කන් පෙති කෙනිතුවා සීතල
නින්දේ සිහින අහු මුළුවල
බින්දේ නිහැඬියාවම ගම

වැකඳු දෙවැට අඩි පාරෙ ලන්ද
සීපද ගමන් පැන දිව්වා පින්න
දෝ තෙම පිපුනි ඉඳලොලු ත් කැවිල
ආ තත විතත ඝණ සුසිරයෙ ඇසුනි

කේම බයව - අවුලේගම

# උස යෑම

තිස් වසරකට ඉස්සර
මෙතන තිබුණේ පොඩි පැලකි
පොල්පිත්තක් හේත්තු කර බිත්තියට
මට ද නැග ගත හැකි විය
ඒහි වහලයට
ලෝකය ම දිනා ගන්නෑ යි
සන්තෝසයෙන් උඩ පැන්න සඳ
පොල් අතු කඩාගෙන
බිමට ද වැටිණි මා

ඒතැන අද
විසල් ගොඩනැගිල්ලකි
ළං ළං වන විට
කොන්ක්‍රීට් දැළ දමා
අහස වෙත තව තව වැඩෙන
පාමුලට ආ මදෙස
හිස නො තමා රවා බලන
මුළු අහස ම ඔසවාගෙන සිටින
කෙමෙන් මා කුඩා කොට
අගුටුමිට්ටකු කොට
නො පෙනී යවන

ජී. පී. දසනායක




# පිහගෙන කෑම

ආරාධනා කරනු කෙනෙක් නැති
බෙදා දෙන්නටත් කව්රුත් නැති
පාරිභෝජනය මිස
ගෙනියන පුරුද්දක් නැති
ගල් සියඹලා ගහේ
කුරුල්ලක්ගේ දන්සැල
තිබුණ තැනවත් නොපෙනෙන්ට
කුසගිනි කාරයෝ ඇවිදින්
සොබාදම් මාතාවන්ට
පිං අනුමෝදම් වෙන්ට
හොඳින් වළඳලා


චන්ද්‍රසේන හේරත්



# කොමර්ෂල් බැංකුවේ e-Passbook ඇප් සේවාවට ආකර්ශණීය නවාංග එකතුවක්

කොමර්ෂල් බැංකුව විසින් සිය කොම්බෑන්ක් ඊ-පාස්බුක් ජංගම දුරකථන ඇප් සේවාව ආකර්ශනීය නවාංග සමග යාවත්කාලීන කර තිබේ. මෙම ඇප් සේවාවට ස්වයංව ලියාපදිංචි වීම සහ ඒ මොහොතේදීම ගනුදෙනු වාර්තා ලබාගැනීම මෙම නවාංග වලට ඇතුළත් වන අතර මේ තුළින් ගිණුම් කළමනාකරණයේ සහ භාවිතා කිරීමේ පහසුව වැඩි දියුණු වන බව බැංකුව සඳහන් කරයි.

මෙම වැඩිදියුණු කිරීම නිසා ගිණුම් හිමියන්ට බැංකු ශාඛාවකට නොගොස් ස්වයං ලියාපදිංචිය මගින් මෙම ඇප් සේවාව සක්‍රිය කරගත හැකි අතර එය භාවිතා කරන්නන්ට ජංගම ගිණුම්, ඉතිරි කිරීමේ ගිණුම් සහ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම් තම කොම්බෑන්ක් ඊ-පාස්බුක් ජංගම දුරකථන ඇප්



සේවාව මගින් ස්වයංව එකතු කර ගැනීමට, ඉවත් කර ගැනීමට සහ සමූහගත කිරීමට අවස්ථාව ලබාදී ඇත.

මේ සමගම මෙම ඇප් පහසුකම භාවිතා කරන ගනුදෙනුකරුවන්ට සෑම ගනුදෙනුවකදීම ඒ මොහොතේදී ගනුදෙනු වාර්තා ලැබෙන බව බැංකුව සඳහන් කරයි. මීට අමතරව, මෙම ඇප් සේවාව භාවිතා කරන්නන්ට විශේෂ ගනුදෙනු පිළිබඳව තොරතුරු එම ගනුදෙනුවල දිනය, තොරතුරු හෝ මුළු මුදල ඇතුළත් කිරීමෙන් ක්ෂණිකව බලාගත හැක. එසේම, ගිණුම් හිමියන්ට මෙම ඇප් සේවාව මගින් ක්‍රෙඩිට් කාඩ්පත් ණය පිළිබඳ තොරතුරු දැනුම් දෙනු ඇත.

මෙම ඇප් සේවාවේ නව බයෝමෙට්‍රික් ලොගින් උපාංගය මගින් ගිණුම් හිමියන්ට face ID සහ ඇඟිලි සලකුණු භාවිතා කිරීම මගින් ලොගින් වීමට අවස්ථාව ලබාදී තිබෙන නිසා ඇප් පහසුකම භාවිතා කිරීමට සෑම අවස්ථාවේදීම රහස් වචනය ඇතුළත් කළ යුතු නොවේ.

ගිණුම් හිමියන්ට නොමිලේ ලබාදෙන මෙම ඇප් සේවාව මගින් පසුගිය දින 30 සඳහා ගිණුමේ ශේෂය සහ ගනුදෙනු ඒ මොහොතේම තමන් කොතනක හිටියත් ජංගම දුරකතනයට හෝ ටැබ් පරිගණකයට ලබාගැනීමේ අවස්ථාව හිමිවේ. බැංකුව සඳහන් කරන්නේ භාවිතා කරන්නා අන්තර්ජාලයට සම්බන්ධ වී සිටින විට කොම්බෑන්ක් පාස්බුක් ඇප් සේවාව ස්වංක්‍රියව යාවත්කාලීන වන බවයි.

# කුළුබඩු ආනයන ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය සුවිශේෂී මූල්‍ය විසඳුම් නිර්මාණය කිරීමට සාකච්ඡා



**කුළුබඩු ආනයන ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් එම ව්‍යාපාර වර්ධනය කිරීමට අවශ්‍ය සුවිශේෂී මූල්‍ය විසඳුම් නිර්මාණය කිරීමට මහජන බැංකුව සහ කුළුබඩු සහ ඊට සමගාමී නිපැයුම් නිෂ්පාදකයින්ගේ සංගමය (SAPPTA) සාකච්ඡාවක නිරත විය.**

මෙම සාකච්ඡාව මෑතකදී කොළඹ වාණිජ මණ්ඩල ශාලාවේ පැවැත්වූ අතර, එයට කුළුබඩු සහ ඊට සමගාමී නිපැයුම් නිෂ්පාදකයින්ගේ සංගමයේ (SAPPTA) සභාපති රොමේෂ් ජයසූරිය මහතා, සංගමයේ වෙනත් නිලධාරීන්, මහජන බැංකුවේ සභාපති සුජීව රාජපක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී රංජිත් කොඩිතුවක්කු යන මහත්වරුන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි (ව්‍යවසායකත්ව බැංකු කටයුතු) ක්‍රිශානි නාරංගොඩ සහ සහකාර සාමාන්‍යාධිකාරී (කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය) වික්‍රම නාරායන මහතා සහභාගී විය.

ස්වයංපෝෂිත ආර්ථිකයක් කරා රට රැගෙන යාමේ රජයේ සංකල්පයට සහයෝගය දැක්වීමේ අරමුණින් මහජන බැංකුව විසින් කෘෂි කර්මාන්ත, ධීවර කර්මාන්ත, පශු සම්පත් කළමනාකරණය, කුඩා හාල් මෝල්, උයන් වතු වැවීම, කිරි නිෂ්පාදන සහ අනෙකුත් දේශීය කර්මාන්ත නඟා සිටුවීම උදෙසා 'අස්වැන්න' නමින් ණය යෝජනා ක්‍රමය රටට හඳුන්වා දුන්නේය. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලාංකික කුළුබඩු අපනයන කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම උදෙසා ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කළ අතර, මේ හරහා රටේ කෘෂි කාර්මික ක්ෂේත්‍රය ගොඩනංවමින් රටට අවශ්‍ය විදේශ විනිමය උපයාගැනීමට දේශීය කර්මාන්ත නඟා සිටුවීමට අපේක්ෂා කරයි.

අස්වැන්න ණය යෝජනා ක්‍රමයට කෘෂි කාර්මික ක්ෂේත්‍රයෙන් ලැබුණු ධනාත්මක ප්‍රතිචාර නිසා අනෙකුත් කෘෂි ක්ෂේත්‍රයන් සමඟ ද උපාය මාර්ගික සහසම්බන්ධතාවයන් ඇතිකරගනිමින් මෙම ව්‍යාපෘතිය සමස්ත කෘෂි කාර්මික ක්ෂේත්‍රයන්ට අවශ්‍ය මූල්‍ය විසඳුම ලබාදෙන මූලාශ්‍රය ලෙස වඩාත් පුළුල්ව ක්‍රියාත්මක කිරීමට මහජන බැංකුව අපේක්ෂා කරයි. කුළුබඩු නිෂ්පාදන ක්ෂේත්‍රය ගත්කළ කුඩා ගොවීන්, කුළුබඩු එකතුකරන්නන්, නිපැයුම් ක්‍රියාවලියට දායකත්වය දක්වන්නන් සහ අපනයනය කරන්නන් ආදී වූ එම ක්ෂේත්‍රයේ නියුතු සියලුදෙනා වෙත අවශ්‍ය නිවැරදි මූල්‍ය විසඳුම් ලබාදෙමින් ඔවුන් බලගැන්වීම හරහා රටට ඵලදායී සේවාවක් ලබාදීම මෙහි අවසාන අරමුණයි.

සාකච්ඡාව අතරතුර (SAPPTA) නියෝජිතයන් වෙත මහජන බැංකුව වෙතින් ලැබෙන සියලු මූල්‍ය විසඳුම් ක්‍රමවේදයන් පිළිබඳව පැහැදිලි පරිපූර්ණ කරුණු දැක්වීමක් එම බැංකුවේ නියෝජිතයන් විසින් සිදුකළ අතරල SAPPTA නියෝජිතයන් විසින් කුළුබඩු නිෂ්පාදන ක්ෂේත්‍රයේ මුල සිට අගට නිපැයුම් ක්‍රියාවලිදාමය පිළිබඳව පැහැදිලි චිත්‍රයක් මහජන බැංකු නිලධාරීන් වෙත ගෙන හැර දැක්විය. මෙහිදී විවිධ කුළුබඩු වර්ග ජාත්‍යන්තර වශයෙන් වැඩි දුරටත් ප්‍රවර්ධනය කිරීම තුළින් ඉහළ විදේශ විනිමය ප්‍රමාණයක් රට තුළට ගෙන ඒමේ හැකියාව හඳුනාගත් දෙපාර්ශවය ගම්මිරිස් අපනයනය සංවර්ධනය කිරීම වෙනුවෙන් අවශ්‍ය මූලික ක්‍රමවේදයන් වේගවත් කිරීමට එකඟතාවයක් ඇති කරගත්තේය. මෙම සාකච්ඡාවෙන් පසු ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් සහතිකවන පරිදි නිෂ්පාදනය සිදුකිරීමට සහ නිෂ්පාදන තත්වය ඉහළ නැංවීම සඳහා කුළුබඩු ක්ෂේත්‍රයේ නිපැයුම් ක්‍රියාවලි දාමයේ සියලු පියවරයන් සඳහා අවශ්‍ය නිවැරදි මූල්‍ය විසඳුම් නිර්මාණය කරදීමට මහජන බැංකුව අපේක්ෂා කරයි. මීට අමතරව ජාත්‍යන්තරයට අපනයනය කිරීමේ ශක්‍යතාවය ඇති අනෙකුත් කෘෂි නිෂ්පාදන වෙත ද තමන්ගේ මූල්‍ය විසඳුම් ලබාදීමේ ක්‍රියාවලිය ව්‍යාප්ත කිරීමට බැංකුව කටයුතු කරයි. සාම්ප්‍රදායික මූල්‍ය ක්‍රමවේදයන් අතික්‍රමණය කරමින් නව්‍ය මූල්‍ය විසඳුම් හඳුන්වාදීම හරහා ණය ඉල්ලුම් කරන්නන් වෙත තමන්ට අවශ්‍ය ණය මුදල් නම්‍යශීලීව සහ වඩාත් පහසුවෙන් ලබාගැනීමේ අවකාශය නිර්මාණය කිරීමට මහජන බැංකුව ඇපකැපවී ක්‍රියාකරයි.


**සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් සමාගම**
**சிலோன் ஷிப்பிங் லைன்ஸ் லிமிட்டட்**
**Ceylon Shipping Lines Ltd.**

අංක 450, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.
දුරකථන : +94 11 2689500-508
ෆැක්ස් : +94 11 2689510/2674347
ඊ මේල් : csl123@sltnet.lk
අන්තර්ජාලය : www. ceylonshippinlines.com

இல: 450, டீ. ஆர். விஜேவர்தன மாவத்தை,
கொழும்பு 10, இலங்கை.
தொலைபேசி : 0094 11 2689500-508
தொலைநகல் : 0094 11 2689510, 2674347
மின்னஞ்சல் : csl123@sltnet.lk
இணையம் : www.ceylonshippinglines.com

450, D.R. Wijewardena Mawatha,
Colombo 10, Sri Lanka.
Tel : 2689500-508 Fax : 2689510/2674347
E-mail : csl123@sltnet.lk
Web: www.ceylonshippinglines.com

**ප්‍රධාන නිෂ්කාශන මධ්‍යස්ථානය**
**කොළඹ / கொழும்பு / Colombo**

අංක. 760, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09, ශ්‍රී ලංකාව.
දුරකථනය : +94 11 268-0301-5
ෆැක්ස් : +94 11 2680309/10
ඊ-මේල් : cslupb@sltnet.lk

இல. 760, டொக்டர் டெனிஸ்டர் தி சில்வா மாவத்த,
கொழும்பு 09, ஸ்ரீ லங்கா.
தெலைபேசி : +94 11 268-0301-5
தொலைநகல் : +94 11 2680309/10
மின்னஞ்சல் : cslupb@sltnet.lk

**760, Dr. Danister De Silva Mawatha,**
**Colombo 09, Sri Lanka.**
**Tel: +94 11 2680301-5 Fax: +94 11 2680309/10**
**Email: cslupb@sltnet.lk**

**නිෂ්කාශන මධ්‍යස්ථානය**
**මහනුවර / கண்டி / Kandy**

අංක 175, පරණ ගංතොට පාර,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන : +94 81 2234356-57, +94 81 4471935
ෆැක්ස් : +94 81 2234360

இல. 175, பழைய கங்தொட வீதி,
மாவில்மட, கண்டி.
தெலைபேசி : 0094 812234356-57,0094 814471935
தொலைநகல் : 0094 812234360

175, Paranagantota Road,
Mawilmada, Kandy.
Tel : +94 81 2234356-57, +94 81 4471935
Fax : +94 81 2234360

**නිෂ්කාශන මධ්‍යස්ථානය**
**මඩකලපුව /மட்டகளப்பு / Batticaloa**

අංක: 134, මහා වීදිය, අඩලච්චේනෙයි 09.
දුරකථන/ෆැක්ස් : +94 67 2277302
ජංගම : +94 774503759

இல. 134 பிரதான வீதி, அட்டாளைச்சேனை 09.
தெலைபேசி-பெக்ஸ் : 0094(0)67 2277302
கைத்தொலைபேசி : 0094 774503759

No. 134, Main Street, Addlaichchenai 09.
Tel/Fax : +94 67 2277302
Mobile : +94 774503759


Need assistance to extend your visa in Sri Lanka
Call us for further details,
Roshadi : 077 356 1210
Keerthi : 077 739 7055
Ceylon Shipping Lines Travels,
No. 450, D.R. Wijewardana Mw.,
Colombo 10.
Tel : 011 - 2689500 - 8
Email : csltravels@sltnet.lk
CSL
TRAVELS

# කොරෝනාවලින් පසු ?



ලොව පුරා සියලු රාජ්‍යයන් කොරෝනා ආසාදනයෙන් බේරීම සඳහා දැවැන්ත අරගලයක යෙදී සිටින්නේ තම රටවල අනාගතය බිල්ලට දීගෙනය. ඇමරිකාව ඉතාලිය ස්පාඤ්ඤය වැනි රටවල් අනාගතයත් ජනතාවත් යන දෙකම බේරා ගැනීමේ ඌ වුලයි කැඳයි යන න්‍යායට යෑම හේතුවෙන් ලොකු අර්බුධයකට මේ වන විට පත්ව සිටිති. බටහිර රටවල් හා ඇමරිකාව හැසිරෙන ආකාරයෙන් පෙනී යන්නේ රෝගීන් මර්දනය කළ වහාම පෙර සිටි තත්වයට රට පත් කර ගැනීමයි. කොරෝනා වලින් පසුවත් ලෝකවාසී ජනයාගේ සිතුම් පැතුම් කියුම් කෙරුම් මේ ලෙසින්ම සිදුවුවහොත් ඊළඟට සිදුවන්නේ මීටත් වඩා බරපතල තත්වයකි.

මේ රෝගය සහමුලින්ම මේ ලෝකයෙන් වඳවී යන්නේ නැත. එය ලොව කොතනක හෝ පවතිනු ඇත. එතෙක් ලෝකය අනාරක්ෂිතය. ශ්‍රී ලංකාවේ අවසන් රෝගියා ද වාර්තා නොවන තත්ත්වයට පත්වේ යැයි සිතිය නොහැක. හැම රටකම තත්ත්වය එළෙසමය. අද වන විට ලෝකය අක්‍රීය තත්ත්වයට පත්වී ඇත.

ලෝක ජනගහනයෙන් මිලියන පනහක් පමණ අන්ත දුගීභාවයට පත්වේ යැයි මේ වන විට අනුමාන කරයි. එම තත්ත්වය යටතේ ලංකාව වැනි රටවලට කුමන ඉරණමක් අත්වේදැයි සිතා ගැනීම අපහසුය. අද වන විට හෝටල් කර්මාන්තයට අනාගතයක් නැත.

සංචාරක ව්‍යාපාරය තුළ ඍජු හා වක්‍ර රැකියා ප්‍රමාණය ලක්ෂ ගණනකි. සංචාරක මග පෙන්වන්නන් පළතුරු එළවළු ඇතුළු සෙසු යටිතල පහසුකම් හා සේවා සපයන්නන් අති විශාල ප්‍රමාණයක ගේ රැකියා අවිනිශ්චිත තත්ත්වයට පත්ව තිබේ. විශේෂයෙන් ඇඟළුම් ක්ෂේත්‍රයේ වැඩිම අපනයන ප්‍රමාණය සිදුකරන්නේ යුරෝපා රටවලටය. මේ වනවිට යුරෝපය ඇද වැටී අවසානය. දෛනිකව අවශ්‍ය වන ඇඳුමක් අඩුමිලට ලබා ගැනීමට ඔවුන්ටත් සිදුවනු ඇත. ගමනින් ගමනට දවසෙන් දවසට ඇඳුම් මාරු කිරීමේ ආර්ථික ශක්තිය ඒ රටවල ජනයා තුළ ද නැත. ඒ නිසා ඇඟළුම් ක්ෂේත්‍රයට එන ඇනවුම් ප්‍රමාණය සීඝ්‍රලෙස පහළ බසිනු ඇත.

ඊළඟ ප්‍රධාන අභියෝගය විදෙස් ශ්‍රමිකයින්ය. ඔවුන්ට ඇති අවධානම සහ ඒ ඒ රටවල සිදුවන ආර්ථික අවපාතයන් තුළ විශාල ශ්‍රමික පිරිසක් ආපසු තම මව් රටවල් බලා පැමිණෙනු ඇත. ශ්‍රී ලාංකික විදෙස් ශ්‍රමික ශ්‍රම බලකාය ලක්ෂ 20 ක් තරම් සිටිති. එම ප්‍රමාණයෙන් ලක්ෂ 15 ක් ආපසු පැමිණෙතැයි උපකල්පනය කළහොත් ලක්ෂ 15 ආදායම හා ලක්ෂ 15 ක විදේශ විනිමය රටට අහිමි වනු ඇත. එම ලක්ෂ 15 සඳහා දිනකට ආහාර වේල් ලක්ෂ 45 අවශ්‍යය. අඩුම තරමින් එයින් ලක්ෂ 10 ක් වත් කුමන හෝ රැකියාවක් අපේක්ෂා කරති. ඇඟළුම් ක්ෂේත්‍රයේ හෝටල් ක්ෂේත්‍රයේ අහිමි වන රැකියා සඳහා එම ජනයාහට නව රැකියා කෙසේ උත්පාදනය වේද?

ඇඟළුම් ක්ෂේත්‍රය බිඳවැටීම තුළ අපනයන ක්ෂේත්‍රයේ පිහිටුවා ඇති අපනයන සමාගම් විශාල ප්‍රමාණයකට සිය ඇනවුම් අහිමි වනු ඇත. ඒ තුළ රැකියා කරන ශ්‍රම බලකාය අතරමං වනු ඇත. මේ වායේ වැටුප් ලබා දීම කල්බදු ක්‍රමයට ලබාගත් ඔවුන්ගේ වාහන ඔවුන්ගේ බැංකු ණය ඔවුන් පුරුදු පුහුණු වී සිටි රැකී රක්ෂා සඳහා කුමන ඉරණමක් අත්වේද?

යුරෝපා රටවල මේ වන විටත් මිලියන දෙතුන් සීයකට සිය රැකියා අහිමි වී අවසානය මේ වන විට සෑම රටක්ම සිදු කරන්නේ තම රටවල මහා භාණ්ඩාගාරය සතු මුදල් ජනතාවට බෙදා හැරීමයි. ඊළඟට කළ යුතුව ඇත්තේ භාණ්ඩාගාර බිල්පත් අලෙවි කිරීමයි. යම් යම් ආයතන තමන් සතු වත්කමට සාපේක්ෂව යම් අපෙක්ෂාවක් පෙරදැරි කරගෙන ඒවා මිලදී ගනිති. එයද සිදුවන්නේ අඩු ලංසුවටය.

එයද එතරම් කාලයක් කරගෙන යා නොහැක. අනතුරුව මුදල් අච්චු ගැසීමට සිදු වෙයි. ඊළඟට සිදුවන්නේ උද්දමනය ඉහළ යෑමයි. මෙය අපට පමණක් නොව ලෝකයටම සිදුවන්නකි.

ලෝකයේ සිදුවන විරැකියාව අතිරික්තය උග්‍ර තත්වයකට පත්වන්නේ එක් අතකින් තිබෙන

**ඇඟළුම් ක්ෂේත්‍රය බිඳවැටීම තුළ අපනයන ක්ෂේත්‍රයේ පිහිටුවා ඇති අපනයන සමාගම් විශාල ප්‍රමාණයකට සිය ඇනවුම් අහිමි වනු ඇත. ඒ තුළ රැකියා කරන ශ්‍රම බලකාය අතරමං වනු ඇත. මේ වායේ වැටුප් ලබාදීම කල්බදු ක්‍රමයට ලබාගත් ඔවුන්ගේ වාහන ඔවුන්ගේ බැංකු ණය ඔවුන් පුරුදු පුහුණු වී සිටි රැකී රක්ෂා සඳහා කුමන ඉරණමක් අත්වේද?**

රැකියා අහිමි වීමත් අනිත් අතින් රැකියා වෙළඳ පොළට අලුතින් පිරිස් එකතුවීමත් හේතුවෙනි. එහෙත් ලෝකය සැරසෙන්නේ කෝවිඩ් 19 පරදා තිබුණු පරණ ලෝකය නැවත ස්ථාපිත කිරීමටය. එය සිතන තරම් පහසු කටයුත්තක් නොවේ.

මත්ද්‍රව්‍ය භාවිතය සොරකම් දූෂණ වංචා ඉහළ යෑමට මෙය ප්‍රධාන හේතුවක් වෙයි. ලොව සෑම රටක්ම මේ උවදුරෙන් බේරීමට වගබලා ගත යුතුය.

ඊට අමතරව බොහෝ ජනයා අත්‍යාවශ්‍ය සේවා හා අවශ්‍යතා සඳහා පමණක් යොමු විය යුතුව ඇත. ඇත පිටිසර ගොවිතැනක් කරගෙන අඩු අවශ්‍යතා ප්‍රමාණයක් සමග ජීවත් වන පිරිස් වලට මෙම අවධානම ඇඩිව බලනොපාන නමුත් අන්ත දරිද්‍රතාවෙන් පෙලෙන පිරිස් කබලෙන් ලිපට වැටෙනු නොවනුමානය.

විශේෂයෙන් ලංකාව වැනි රටවලට සාගත තත්ත්වයන් උදා නොවුණත් බටහිර, මැදපෙරදිග හා අප්‍රිකා කලාප වලට දැඩි ආහාර හිඟයක් ඇති විය හැක.

මින් ඉදිරියට ලෝකය වෙනස් මාවතක සිට සිතීමට කටයුතු කරනු ඇත. අනුන් මත යැපෙන ලිබරල් ධනවාදයෙන් ඔබ්බට යා යුතුව ඇත. ලංකාවේ 1977 ට පෙර තිබූ සංවෘත ආර්ථිකයට අපට ආපසු යායුතුව ඇත. තම රටට අවශ්‍ය දේ තම රට තුළ නිපදවා ගැනීමේ සංකල්පයයි. මෙය ලොව හැම රටකටම සාධාරණ වනු ඇත. අද වන විට ආධාර පහසුකම් ලබා ගැනීමට ලොව කිසිඳු රටකට කිසිඳු රටක් ඉතිරි වී නැත. අඩුම තරමේ අත්‍යාවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට හෝ තැනක් නැති තරම්ය. විශේෂයෙන් ආහාර හා බෙහෙත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය දෙකකි. ලොව බොහෝ රටවල් ආහාර බෙහෙත් හිඟයන්ට මුහුණ දෙමින් සිටිති. විශේෂයෙන් තම තම රටවල පැවති පාරම්පරික වෛද්‍ය ක්‍රම කෙරෙහි වෙනදාට වඩා අවධානය යොමු විය යුතු වන කාලයකි.

ඒ විතරක් නොව ඒ ඒ කලාප ඒ ඒ රටවල් ආදියට ආවේනිකව තිබූ ජීවන රටාවද මිනිසාට හුරුවීමට සිදුවනු ඇත. බටහිරට සුදුසු ආහාර බෙහෙත් ආසියාතිකයින් භාවිතා කිරීම තුළ මිනිස් සිරුරේ පවතින ජෛව වෙන්ස් වීම් විවිධ රෝගාබාධයන්ට පිටුවහලක් බව අද වනවිට සනාථ වී හමාරය. ඒ විතරක් නොව ආසියාතික ජීවන රටාව බටහිරටද නුසුදුසුය.

මෙතෙක් ආ විශ්ව ගම්මාන සංකල්පය පිළිබඳව නැවත සිතීමට ලෝකවාසීන්ට සිදුවනු ඇත. විශ්ව ගම්මානය තුළ අතේ දුරින් තම තමන්ගේ අනන්‍යතාව රැකගන කටයුතු කළොත් ජය හිමි වනු ඇත. මෙම සිදුවීමත් සමඟ ලෝක බල තුලනය ද වෙනස් වනු ඇත. ඇමරිකාවට ඇති බියද එයයි. එරට ජනයා බිල්ලට දී ඇමරිකාව ප්‍රමුඛ බටහිරන් දඟලන්නේ තම ආධිපත්‍ය රැක ගැනීමටය. එහෙත් එය එසේ නොවනු ඇත.








# MAHIYANGANAYA

**GROUP OFFER**
**LKR 8400**
(Per Person Rate)

** Minimum 10 pax required*
** Offer valid till end of September 2020*

Separate activities can be arrange on a special rate :-

* Rathnaella Water Fall Trek
* Veddah Village Visit
* Maduruoya Safari
* Weheragala Mountain
* Village Walk

## Package Including:

- Hotel accomadation on full board basis
- Colombo to hotel return transfer on A/C vehicle

Call us now,
Eranga - 0772672970
Lakmali - 0773572835
Roshadi - 0773561210

Ceylon Shipping Lines Travels,
No. 450, D.R. Wijewardana Mawatha,
Colombo 10.
Tel: 011 - 2689500 - 8

CSL TRAVELS

# මින්නේරි වනයේ අලි නිවුන් දරු උපතක්



**ඉතාම කලාතුරකින් අසන්නට ලැබෙන සිද්ධියක් වශයෙන් ඇතින්නියකට නිවුන් පැටවුන් ඉපදීමේ දුර්ලභ සිදුවීමක් මින්නේරිය වනෝද්‍යානයෙන් වාර්තා වෙයි.**

ඉතාම කලාතුරකින් අසන්නට ලැබෙන ඇතින්නියකට නිවුන් පැටවුන් ඉපදීමේ දුර්ලබ සිදුවීමක් මින්නේරිය වනෝද්‍යානයෙන් වාර්තා වෙයි. මෙයට පෙර එවැනි සිදුවීම් ලෝකයෙන් ඉදහිට වාර්තා වුවද එම අවස්ථාවල එම උපන් පැටවුන් මිය යන බව කියවෙයි. සිංහල රජකාලේ සිදුවූ එවන් සිදුවීමක් පිළිබඳව ලේඛනාගාර වාර්තාවල කියවෙයි.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජ සමයේ රජතුමාගේ ඇත්ගාලේ මෙලෙස නිවුන් දරු අලි උපතක් සිදුවූ බවට වාර්තා රාජ්‍ය ලේඛනාගාරයේ ඇත. එහිද පළමු පැටවා මරණයට පත්වී ඇති අතර ඉන් පැය කීපයකට පසු දෙවන පැටවා උපත ලබා ඇති බවත් එම පැටවාද කෙටි කලකදී මරණයට පත්වී ඇති බවත් සඳහන්ය.



මින්නේරිය වනෝද්‍යානයේ ඉතාමත්ම සෞඛ්‍ය තත්ත්වයෙන් සිටින අලි පැටවුන් දෙදෙනකු මේ දිනවල නිරීක්ෂනය වී ඇත. වන ජීවී නිලධාරීන් ගේ නිරීක්ෂණයට අනුව මොවුන් නිවුන් පැටවුන් බව හදුනාගෙන ඇති අතර පසුව ඩී.එන්.ඒ. පරීක්ෂනයක් මගින් එය තහවුරු කිරීමටද කටයුතු කරන බව පවසයි.

---

## බුදු අම්මෝ !

ධනවත් සිටුවරයෙකුට අශ්වයෙකු මිලදී ගැනීමට අවශ්‍ය විය. ඔහු අශ්වයින් පුහුණුකර අලෙවි කරන්නෙකු හමුවී එම අශ්වගාලේ සිටි උසින් වැඩි අලංකාරයෙන් අගතැන්පත් වේගයෙන් දුවන ජවසම්පන්න අශ්වයා තෝරා ගත්තේය.

මෙම අශ්වයා පුහුණු කර තිබුණේ වෙනස්ම ආකාරයකිනි.

“යාන්තං ඇති” කියූ සැනින් අශ්වයා වේගයෙන් දුවයි.

“බුදු අම්මෝ“ යැයි පැවසුවහොත් අශ්වයා නවතී.

සිටුවරයා මෙය පැටළුම් සහගතය. හදිසියකට මතකයට එන්නේ නැත.

අශ්වයා පිට නැගීමට ද වෙහෙසකර කටයුත්තකි. ඒ අශ්වයා උස බැවිනි.

සිටුවරයා අශ්වයා ලගට ගොස් ඉතා අපහසුවෙන් උගේ පිටමතට ගොඩ විය. ඒ අමාරුවෙන් ගොඩවීම නිසා සිටුවරයාට “යාන්තං ඇති” යැයි කියවිනි.

ඒ සැනින් අශ්වයා වේගයෙන් දුවන්නට විය. සිටු වරයාට පාලනය කරගත නොහැකි තරම්ය. අශ්වයා ඉදිරියෙන් විශාල හෙලක් ඇති බව සිටුවරයා දුටුවේය.

“හෝව් ... හෝව්..” යැයි සිටුවරයා කෑගැසිය. අශ්වයා නොනැවතී ඉදිරියට දිව්වාය. හෙළ ආසන්නයේදීම සිටුවරයාට “බුදු අම්මෝ..” යැයි කියවිනි. අශ්වයා හෙළ ආසන්නයේ ම නැවතිනි.

ඒ සමගම සිටුවරයාට “යාන්තං ඇති” යැයි කියවිනි.

## ඉටිපන්දම නිවා දැමීම

විවාහ වී වසර කීපයක් ගතවුවද දරුවන් නොඉපදුන බැවින් දුකින් සිටි යුවළක් දිනක් දේවස්ථානයේ දේවගැතිවරයාට ඒ බව කියා සිටියහ.

“මම ලබන මාසේ වතිකානුවට යනවා. එහිදී මේ බව මතක් කරලා ඉටිපන්දමක් පත්තු කරන්නම්” යැයි කීය.

වසර කීපයකට පසු මෙම දේවගැතිවරයා එම යුවළගේ නිවසට පැමිණියේ ඔවුන්ගේ සැප දුක් සොයා බැලීමටය.

නිවසට පැමිණෙන විට දරුවන් කීපදෙනෙකු සමඟ මහත් ආයාශයෙන් යුද්ධයක් කරන බව දැක ගත හැකි වුවත් සැමියා දක්නට නොවුණි.

“කෝ මහත්තයා” දේව ගැතිවරයා විමසූහ. “එයා වතිකානුවට ගියා” බිරිඳ කීය.

“ඒ ඇයි” දේවගැතිවරයා විමසූහ.

“ඔබතුමා පත්තු කලා යැයි කී ඉටිපන්දම නිවා දාන්න”.

# සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් සමාගම
# சிலோன் ஷிப்பிங் லைன்ஸ் லிமிட்டட்
# Ceylon Shipping Lines Ltd

**ඔබේ භාණ්ඩ මව් රට ගෙන ඒමට ලොව පුරා සිටින අපගේ නියෝජිත මහතුන් හමුවන්න.**

## ඕස්ට්‍රේලියාව/அவுஸ்திரேலியா/Australia

සී. එස්. එල්. ඕස්ට්‍රේලියා
**சி. எஸ். எல். அவுஸ்திரேலியா**
**C. S. L. Australia**
10/2, Dingley Ave Dandenong,
Victoria 3175, Australia.
☎ +61397929877/0061 396023966
📠 +61397924655
✉ cargo@skyway.com.au/www.skyway.com.av

## ජපානය / ஜப்பான் / Japan

ජූරියා ඉන්ටර්නැෂනල්
**ஜுரியா இன்டர்நெஷனல்**
**Juria International**
☎ +81283205383
📠 +81283205384
Mobile - 0081-(90) 31027600
✉ tea@cronos.ocn.ne.jp
tcperera@ymail.com / csl@juriaweb.com

## සිංගප්පූරුව / சிங்கப்பூர் / Singapore

එම් ඇන්ඩ් එස් එක්ස්ප්‍රස් කාර්ගෝ ලොජිස්ටික්ස්
**எம் என்ட் எஸ் எக்ஸ்பிரஸ் கார்கோ லொஜிஸ்டிக் (பிரை)லிமிடட்.**
**M & S Express Cargo Logistics Pte. Ltd.**
No. 23, Daihousie Lane, Singapore - 209688
☎ +6563966614 / +6563966615
📠 +6563966621
✉ sales@ms5.com.sg / mifras@ms5.com.sg

## දෝහා - කටාර් / தோஹா - கட்டார் Doha - Qatar

ලාන්ස් ග්ලෝබල් ලොජිස්ටික්ස්
**லான்ஸ் க்ளோபல் லொஜிஸ்டிக்ஸ்**
**Lans Global Logistics**
PO Box - 31534, Al - Corniche Tower
Doha - Qatar.
☎ +974 40 414141
📠 +974 40 414199
Mobile +974 40 414141 / 077 3601554
✉ cmb@lanslogistics.com

ගල්ෆ් පැල්කන් සර්විසස් කම්පනි (W.L.L.)
**கல்வ் வெல்கன் செர்வீசஸ் கம்பனி**
**Gulf Falcon Services Company (W.L.L.)**
PO Box - 7079, Doha - Qatar.
☎ +974 44869723
📠 +974 77885503 / +974 77883866
✉ gulffalconcargoqatar@gmail.com

## මැලේසියාව / மலேசியா / Malaysia

ජයලංකා / **ஜயலங்கா**
**Jayalanka (M) SDN BHD**
No. 32 - 2 Jalan
14/48 A, Sentul Raya 51000
Kualalampur, Malaysia
☎ 603-40421896 / +966 539222031
00966 532480407
✉ jay_langka@yahoo.com

## කුවේට් / குவைத் / Kuwait

ෆැල්කන් කාගෝ / **பெல்கன் கார்கோ**
**Falcon Cargo**
2952, Safat 13154, Kuwait
☎ 0096522419095, 0096522457315
📠 0096522419098
✉ falconcargo@hotmail.com
falcon_cargo@hotmail.com

යුනයිටඩ් එක්ස්ප්‍රස් ලොජිස්ටික්
**யுனைட்டட் எக்ஸ்பிரஸ் லொஜிஸ்டிக்**
**United Express Logistic**
Office No 26, Qasariya Blg - 2,
Fahaheel, Kuwait
☎ +9652495858/+9652470862/+96522495898
✉ info@unitedexpresslogistics.com

## ඩුබායි යූ ඒ ඊ / டுபாய் யு. ஏ. ஈ. / Dubai U A E

එම්බසි ෂිපිං ඇන්ඩ් ෆ්‍රේට් එල් එල් සී
**எம்பசி ஷிப்பிங் என்ட் பிரைட் எல். எல். சீ**
**Embassy Shipping & Frieght LLC**
P.O. Box. 32863, Al Aweer, Dubai, UAE.
☎ Toll Free - 800 37 30
Hot Line - 055 244 99 66
Tel: +971 4 320 70 70
📠 Fax: +971 4 320 71 71
✉ info@embassyshipping.com
www.embassyshipping.com

නිර්මාන කාගෝ ඇන්ඩ් ලොජිස්ටික් සර්විස් /
**நிர்மான கார்கோ / Nirmana Cargo and Logistic Service**
PO Box 87556, Dubai, U.A.E.
☎ +971 556000826

හිරු කාගෝ / **இரு கார்கோ / Hiru Cargo**
PO Box 15946,
Dubai
☎ +971 42895750
✉ hirumooncargo@gmail.com

මදර්ලයින් ෂිපිං / **மதர்லயின் ஷிப்பிங் /**
**Motherline Shipping**
PO Box 44806,
205 Second Floor,
Zainal Mohebi Plaza Building,
Opp. Centre Point, Dubai
☎ +971 42868791
✉ ravi@motherlines.com

ඕෂන් ලංකා කාගෝ
**ஓசியன் லங்கா கார்கோ**
**Ocean Lanka Cargo**
P.O. Box - 48843,
Dubai - UAE
☎ 00971-04-2640054
Mobile - 00971-0555 491 987
✉ oceanlankacargolk@gmail.com

ලක්බිම කාගෝ / **லக்பிம கார்கோ**
**Lakbima Cargo**
P.O. Box - 22675,
Ajman, UAE.
☎ +971 6 7480522

## බහරේන් / பஹறைன் / Bahrain

කලම්බු කාගෝ කම්පැනි
**கொழும்பு கார்கோ கொம்பனி**
**Colombo Cargo Company**
Bahrain
Block 321, 338, Building No 177
Manama / Alaudayiyah,
Kingdom of Bahrain.
☎ +973 35939343
📠 +973 17 811707
✉ colombosuppliersbhn@gmail.com

## සවුදි අරාබිය / சவுதி அரேபியா Saudi Arabia

### Jeddah

වර්ල්ඩ් වයිඩ් ෆ්‍රේට් / **வேல்ட் வைட் பிரைட்**
**World Wide Freight**
World Wide Link,
(A Div. Of Khalid Nazer Ahames Al
Gahathani Trading Est) Jeddah, K.S.A.
☎ 0505657412/0500773931/0543902880
+96626350650/+96626476087/026350650
✉ imthiyaz85360@yahoo.ca

### දම්මාම් / Dammam / தமாம்

ඒ බී ටී කාර්ගෝ සර්විස් / **ஏ.பி.டி. கார்கோ**
**ABT Cargo Services**
☎ +966550952031

### රියාද් - ரியாத் - Riyadh

ඒ බී ටී කාර්ගෝ සර්විස් / **ஏ.பி.டி. கார்கோ**
**ABT Cargo Services**
Riyadh Office: +966 112700055
☎ +966555892754
+966532083640
✉ abtcargo2016@gmail.com

ෆේම් කාගෝ / **பேம் கார்கோ / Fame Cargo**
P.O. Box 17958, Riyadh 11494
☎ 2442032/4793845/0508273719
📠 4793845 / 00966 - 583090555
✉ fameruhcmb@gmail.com

## ලෙබනන් / லெபனான் / Lebanan

ජිහාඩ් රොක්ස් ෂිපිං ඇන්ඩ් ට්‍රේඩිං
**ஜிஹாட் ரொக்ஸ் சிப்பிங் அன்ட் ரேடிங்**
**Jihad Roukz Shipping & Trading**
JRC, Chbenieh Baadba, Beirut, Lebanon
☎ 00961 - 254733 / 00961 - 3773244
📠 0096111242677
✉ lanka _cargo@hotmail.com

## ස්විට්සර්ලන්තය / சுவிட்சர்லாந்து Switzerland

එම් සී එස් කාගෝ / **எம் சீ எஸ் கார்கோ**
**M C S Cargo**
M.T. & T Gmbh, Sperietweg 1, 8052
Zurich, Switzerland.
☎ 0041-796656563 / 0041- 443025838
✉ mcscargo@swissmail.com

## කැනඩාව / கனடா / Canada

සීකැන් ට්‍රාන්ස්කොන්ටිනන්ටල්
**சீகேன் ட்ரான்ஸ்கொன்டினன்டல்**
**Ceycan Transcontinental**
1981, Boylen Road,
Unit # 5, Mississawga, Ontairo,
L5slR9
☎ +9056739873
📠 +9056739905
✉ cslcanada2001@gmail.com
ceycantrans@gmail.com

## එංගලන්තය / இங்கிலாந்து United Kingdom

ජේ පී එන් ෂිපිං / **ஜே பி என் சிபிங்**
**JPN Shipping**
Unit A2c, Redlands
Coulsdon cR5 2HT wk
☎ 02086680252
✉ info@jpnshippingltd.co.uk

මාස් ග්ලෝබල් ෂිපිං
**மாஸ் குளோபல் ஷிப்பிங்**
**Mass Global Shipping**
☎ 044(0)208 4221232
📠 208 8644244
✉ info@masshipping.com

ඊසි ෂිපිං ලිමිටඩ් / **ஈஸி ஷிப்பிங் லிமிட்டட்**
**Easy Shipping Ltd.**
Unit 15, Liongate Enterprise Park
80, Moden Rd, Mitcham cR4 N4
☎ 02086489092 / 07908787627
📠 info@easyshippingltd.co.uk
www.easyshippingltd.co.uk

ඇට්ලස් ෂිපිං / **அட்லஸ் ஷிப்பிங்**
**Atlas Shipping**
430, High Road, Willesden,
London. NW 10 2HA
☎ 02084596633 / 0794743535
✉ ajantha.atlasshipping@gmail.com

## ඇමරිකාව /அமொரிக்கா /America

කලම්බු එක්ස්ප්‍රස් / **கொழும்பு எக்ஸ்பிரஸ்**
**Colombo Express**
1115, Inman Ave, Suite - 323
Edison NJ - 08820
☎ 1888 232 1952
✉ nishan@colomboexpress.com
www.colomboexpress.com

# Ceylon Shipping Lines Ltd



450, D.R. Wijewardena Mawatha,
P.O. Box 891, Colombo 10, Sri Lanka.
Tel: (011) 2689500-508, 2680311-315
Fax: (011) 2689510, 2674347
E-mail: csl123@sltnet.lk
cslmgmt@sltnet.lk
Web: www.ceylonshippinglines.com
Contact: Neranjan - 0777224617







Ceylon Shipping Lines Ltd.

***Serving with Excellence***

- Customs Bonded Warehousing
- Unaccompanied Personal Baggage Clearing & Door to Door Home Delivery Covering Major Cities in Sri Lanka Connecting with Worldwide Destinations
- Managing Processing, Shipping Forwarding & Distribution of Imports & Exports
- Airline Ticketing & Travel Agency
- City Central Container Depot Freight Station & Island wide Transportation
- Printing & Publishing